මුදල් කොමිෂන් සභාව

2013 වාර්ෂික අයවැයෙන් පළාත් අතර අරමුදල් බෙදා වෙන් කර දීම
පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත කරනු ලබන නිර්දේශ

(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (4) ව්‍යවස්ථාව අනුව)

2013 මාර්තු

නො. 48, වජිර පාර
කොළඹ 04
2013 මාර්තු

මහින්ද රාජපක්ෂ මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති
ජනාධිපති ලේකම් කාර්යාලය
කොලඹ 01

අතිගරු ජනාධිපතිතුමනි,

වාර්ෂික අයවැයෙන් පළාත්වල භාවිතය සඳහා අරමුදල් බෙදා වෙන් කර දීම හා සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (47) ව්‍යවස්ථාව අනුව මුදල් කොමිෂන් සභාව වෙත පැවරී ඇත.

පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නියමිත 2013 වර්ෂය සඳහා වූ මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ මේ සමග ඉදිරිපත් කරමි.

ඔබගේ විශ්වාසී,

ආරියරත්න හේවගේ
සභාපති
මුදල් කොමිෂන් සභාව

පටුන

1. මුදල් කොමිෂන් සභාවේ බලතල 5
1.1 බලය බෙදා හැරීමට අදාල මූලික නීතිමය විධි විධාන 5
1.1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 13 වන සංශෝධනය 5
1.1.2 1987 අංක 42 දරන පළාත් සභා පනත 6
1.1.3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ අට වන සංශෝධනය 6
1.1.4 පළාත් පාලන ආයතන හා ඒවායේ නීතිමය පදනම 7
1.1.5 පළාත් පාලන අරමුදල් 8
2. රජයේ අරමුදල් පළාත්වලට මාරු කිරීම 9
2.1 සාමූහික ප්‍රදාන 9
2.2 උපමාන පාදක ප්‍රදාන 10
2.3 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 11
3. පළාත් අතර සම්පත් බෙදා වෙන් කිරීමේදී භාවිතා කරන ලද උපමාන 14
3.1 සම්පත් බෙදා වෙන් කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදය 20
3.2 අංශ අතර සම්පත් බෙදා වෙන් කිරීමේදී සැලකිල්ලට ගනු ලැබූ කරුණු 22
4. පළාත් ආදායම 24
4.1 රජයේ ආදායම් මාරු කිරීම 24
4.2 බලය බෙදාහරින ලද මූලාශ්‍රවලින් එකතු කරන ලද ආදායම 25
4.3 පළාත් ආදායම් ඉලක්ක සැකසීම 27
4.4 2013 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන 27
4.5 පළාත් ආදායම ඵලදායී ලෙස උපයෝජනය කිරීම 29
4.5.1. බලය පවරන ලද ආදායම් මූලාශ්‍රවලින් ආදායම එකතු කිරීම 29
4.5.2. ආදායම් එකතු කිරීම සඳහා මානව සම්පත් කාර්යක්ෂම අයුරින් උපයෝජනය කිරීම 30
4.5.3. ආදායම් ඵලදායී ලෙස භාවිතයට ගැනීම 30
5. පළාත් අරමුදල් තක්සේරු කිරීම හා බෙදා වෙන් කිරීම 31
5.1 රජයේ අරමුදල් වලට අයත් ප්‍රධාන මූලාශ්‍ර 31

5.2 පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ඉල්ලුම් කිරීම 31

5.3 පළාත් පුනරාවර්තන අවශ්‍යතා සඳහා ඉල්ලුම් කිරීම 32

5.4 පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම 33

5.4.1 ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම 34

5.4.2 පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම 34

5.5 පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම 36

5.6 පළාත් පාලන ආයතන මූල්‍යකරණය 37

6. පළාත් සංවර්ධනයේ ඉදිරි ගමන 39

6.1 ප්‍රාදේශීය සංවර්ධන මූලාරම්භයන් සමඟ අනුගත වීම 39

6.2 ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම 39

6.3 ආයතනික ප්‍රතිඵල රාමුව පිළිබඳ ප්‍රවේශය 39

6.4 ප්‍රතිඵල පාදක අධීක්ෂණය සහ ඇගයීම 40

6.5 පළත් කාර්ය මණ්ඩලය ප්‍රශස්ත ලෙස උපයෝජනයට ගැනීම 41

6.6 පළාත් පාලන ආයතනවල ධාරිතාව ඉහළ නැංවීම 41

6.7 පළාත් ආදායම් නිලධාරීන්ගේ සේවය සඵලදායී අයුරින් යොදවා ගැනීම 42

6.8 පුනරාවර්තන වියදම් තුළින් අත්කර ගනු ලැබූ ප්‍රතිලාභ පිළිබඳ අධ්‍යයනය 42

7. නිගමනය 43

වගු ලැයිස්තුව

වගුව 1: සාමූහික ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම - 2008 – 2012 10
වගුව 2: උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම - 2008 – 2012 11
වගුව 3: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කිරීම සහ නිදහස් කිරීම - 2008 - 2012 13
වගුව 4: දළ ජාතික නිෂ්පාදිතයේ පළාත් දායකත්වය (%) 15
වගුව 5: අංශ අනුව පළාත් දළ ජාතික නිෂ්පාදිතයට සිදු කරන ලද දායකත්වය - 2009 15
වගුව 6: අංශ අනුව පළාත් දළ ජාතික නිෂ්පාදිතයට සිදු කරන ලද දායකත්වය - 2010 16
වගුව 7: අංශ අනුව පළාත් දළ ජාතික නිෂ්පාදිතයට සිදු කරන ලද දායකත්වය - 2011 16
වගුව 8: පළාත් අනුව සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ 1 ට අදාල කාර්ය සාධනය 17
වගුව 9: පළාත් අනුව මධ්‍යනය ඒක පුද්ගල ආදායම - 2009/10 18
වගුව 10 : ප්‍රධාන ආලෝක සැපයුම් මූලාශ්‍රයක් ලෙස විදුලිබලය භාවිතා කරනු ලබන කුටුම්භයන්ගේ ප්‍රතිශතය 19
වගුව 11 : සී හා ඩී මාර්ගවල ප්‍රමාණය 20
වගුව 12: අරමුදල් වෙන් කිරීම සඳහා භාවිතයට ගනු ලැබූ සංයෝජිත දර්ශක 22
වගුව 13: රජයේ ආදායම් මාරු කිරීම - 2011 සහ 2012 25
වගුව 14: මූලාශ්‍ර අනුව එකතු කරන ලද පළාත් ආදායම - 2011 26
වගුව 15: මූලාශ්‍ර අනුව එකතු කරන ලද ආදායම - 2012* (සැප්තැම්බර් දක්වා) 26
වගුව 16: 2013 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන 28
වගුව 17: 2013 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු මුද්දර බදු හා උසාවි දඩ 28
වගුව 18: රාජ්‍ය ආදායම පළාත්වලට මාරු කිරීම - 2013 29
වගුව 19: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පළාත්වලින් කරන ලද ඉල්ලීම් - 2013 32
වගුව 20: පුනරාවර්තන වියදම්වලට අදාලව පළාත් විසින් කරන ලද ඉල්ලීම් - 2013 33
වගුව 21: අනෙකුත් පුනරාවර්තන වියදම්වලට අදාලව පළාත් විසින් කරන ලද ඉල්ලීම් - 2013 33
වගුව 22: මුදල් කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතා - 2013 34
වගුව 23: පළාත් සත්‍ය කාර්යමණ්ඩලයට අදාල තක්සේරු කරන ලද පුද්ගල පඩිනඩි - 2013 35
වගුව 24: පළාත් සඳහා තක්සේරු කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් - 2013 36
වගුව 25: ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කිරීම - 2013 37
වගුව 26: සාමූහික ප්‍රදාන බෙදා වෙන් කිරීම - 2013 37
වගුව 27: පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගේ දීමනා සහ කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිපූරණය සඳහා අරමුදල් වෙන් කිරීම - 2013 38

ඇමුණුම් ලැයිස්තුව

ඇමුණුම I: ආයතනික ප්‍රතිඵල රාමුව - ආකෘති පත්‍ර 1 සිට 6..i

1. මුදල් කොමිෂන් සභාවේ බලතල

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිදු කරන ලද 13 වන සංශෝධනයේ ප්‍රතිපාදන අනුව, මුදල් කොමිෂන් සභාව පිහිටුවන ලදී. ඒ අනුව, මුදල් කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් වනුයේ, රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කරලීමේ අරමුණට අනුව, පළාත් අතර අරමුදල් වෙන් කිරීමට අදාලව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම හා ඒ හා බැඳුනු ප්‍රතිපත්ති, මූලධර්ම හා මාර්ගෝපදේශ සැකසීමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ජ) (3), (4) සහ (5) යන ව්‍යවස්ථාව මඟින් මුදල් කොමිෂන් සභාවේ බලතල පැහැදිලි කොට ඇත.

1. මුදල් කොමිෂන් සභාවේ නිර්දේශ හා උපදෙස් මත පළාත් අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් අරමුදල් රජය විසින් වාර්ෂිකව පළාත් වලට වෙන් කරනු ඇත.

2. පහත දැක්වෙන කරුණු වලට අදාලව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම මුදල් කොමිෂන් සභාවේ වගකීමක් වේ.

   (අ) රජය මඟින් වාර්ෂිකව පළාත් වෙත ප්‍රදානය කරනු ලබන අරමුදල් හා ඒවා බෙදා වෙන් කිරීම පිළිබඳව වූ මූලධර්ම.
   (ආ) පළාත් මූල්‍යකරණය පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලබන වෙනත් ඕනෑම කරුණක්.

3. රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් සහතික කරලීමේ අරමුණ ඇතිව කොමිෂන් සභාව විසින් මූලධර්ම සැකසිය යුතු අතර, එහිදී පහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ඇත.

   (i) එක් එක් පළාතේ ජනගහනය
   (ii) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම
   (iii) සමාජ ආර්ථික විෂමතාවයන් ක්‍රමිකව අවම කිරීමේ අවශ්‍යතාව
   (iv) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායමේ වෙනස වඩා අවම මට්ටමක පවත්වා ගැනීමේ අවශ්‍යතාවය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ජ (7) ව්‍යවස්ථාවට අනුව මුදල් කොමිෂන් සභාව විසින් කරනු ලබන සෑම නිර්දේශයක්ම අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳව ගනු ලබන ක්‍රියාමාර්ග ද පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු වේ.

1.1 බලය බෙදා හැරීමට අදාල මූලික නීතිමය විධි විධාන

1987 වර්ෂයේදී පළාත් සභා ක්‍රමය පිහිටුවීමත් සමඟ ශ්‍රී ලංකාවේ එතෙක් පැවති දේශපාලන හා පරිපාලන ව්‍යුහය තුළ බලය බෙදා හැරීමට අදාලව විශේෂ වෙනස්කම් සිදු විය. මූලික ව්‍යවස්ථානුකූල පදනම් ගණනාවක් මත බලය බෙදා හැරීම රඳා පවතී. ඒ පිළිබඳ සාරාංශගත කිරීමක් පහත දැක්වේ.

1.1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 13 වන සංශෝධනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මඟින් පළාත් සභා ක්‍රමය සමඟ බලය බෙදා හැරීමේ පාලන තන්ත්‍රයක් ස්ථාපිත කෙරිණි. ඒ අනුව, පළාත් සභා විසින් ක්‍රියාත්මක කළ යුතු ව්‍යවස්ථාදායක, විධායක හා මූල්‍ය අධිකාරිය පිළිබඳ හඳුන්වාදීමක් සිදු විය. රජය සහ පළාත් අතර බලය බෙදී යන ආකාරය ලැයිස්තු 03ක් යටතේ පැහැදිලි කොට ඇත. මේ අනුව, සංචෘත ලැයිස්තුවෙහි රජයට අයත් බලතල ද, පළාත් ලැයිස්තුවෙහි

පළාත් සභා වලට අයත් බලතල ද, සමගාමී ලැයිස්තුව තුළ රජය සහ පළාත් සභා විසින් පොදුවේ ක්‍රියාවට නංවන විෂය ක්ෂේත්‍රයන් ද වෙන් කොට දක්වා ඇත. තවද, 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ රජය, පළාත් සභා සහ පළාත් පාලන ආයතන යනුවෙන් එකිනෙකට වෙනස් පාලන තන්ත්‍ර ස්ථර තුනක් ස්ථාපනය කෙරිණි.

පළාත් ලැයිස්තුවෙහි දැක්වෙන පුළුල් බලය බෙදා හැරීම තුළ විෂයයන් රාශියක් සඳහන් වන අතර, ඒ තුළට අධ්‍යාපනය හා අධ්‍යාපන සේවා, පළාත් පාලන, පළාත් නිවාස හා ඉදි කිරීම්, මාර්ග, පාලම් සහ තොටුපොල සේවා, සමාජ සේවා හා පුනරුත්ථාපනය, කෘෂිකර්මය හා ගොවිජන සේවා, ග්‍රාම සංවර්ධනය, සෞඛ්‍යය, දේශීය වෛද්‍ය, ආහාර සැපයුම හා බෙදා හැරීම, සමුපකාර, ඉඩම්, වාරිමාර්ග, සත්ත්ව පාලනය, විනෝද කටයුතු හා ක්‍රීඩා වැනි ක්ෂේත්‍ර අයත් වේ.

පළාත් ලැයිස්තුව තුළ පළාත් සභා විසින් අය කළ යුතු ආදායම් මූලාශ්‍ර අන්තර්ගත කොට ඇති අතර, මෙම වාර්තාවේ 04 වැනි පරිච්ඡේදය තුළ ඒවා විවිධ බදු හා ගාස්තු ලෙස විස්තරාත්මකව දක්වා ඇත. මෙලෙස එකතු කරනු ලබන ආදායම් පළාත් සභා විසින් පළාත් අවශ්‍යතා සපුරා ගැනීම පිණිස යෙදවීම අපේක්ෂා කෙරේ. පළාත්වල අවශ්‍යතාවයන් සපුරාලීමේදී මුහුණ දීමට සිදු වන මූල්‍ය පරතරය පියවා ගැනීම පිණිස රජය විසින් වාර්ෂික අයවැය හරහා අතිරේක අරමුදල් වෙන් කරනු ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් පහත දැක්වෙන දෑ සඳහා ව්‍යවස්ථානුකූල පදනම සපයා ඇත.

- (i) පළාත් සභා පිහිටුවීම
- (ii) පළාත් සඳහා ආණ්ඩුකාරවරුන් පත් කිරීම
- (iii) පළාත් සභාවල සාමාජිකත්වය හා නිල කාලය
- (iv) මහ ඇමතිවරු සහ ඇමති මණ්ඩලය පත් කිරීම සහ බලතල
- (v) පළාත් සභාවල ව්‍යවස්ථාදායක බලතල
- (vi) පරිපාලන යාන්ත්‍රණය තුළ දෝෂයක් ඇති වූ විට ඊට අදාල විකල්ප විධිවිධාන
- (vii) පළාත්වල මහාධිකරණ පිහිටුවීම
- (viii) මුදල් කොමිෂන් සභාව පිහිටුවීම

1.1.2 1987 අංක 42 දරන පළාත් සභා පනත

1987 අංක 42 දරන පළාත් සභා පනත මගින් පහත සඳහන් කරුණු වලට අදාලව පළාත් සභා මගින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග විස්තරාත්මකව දක්වා ඇත.

- (i) පළාත් සභාවල සාමාජිකත්වය
- (ii) පළාත් සභාවල රැස්වීම් සහ අදාල ක්‍රියාමාර්ග
- (iii) පළාත් සභාවල මූල්‍ය පරිපාටිය
- (iv) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් පිහිටුවීම
- (v) ප්‍රධාන ලේකම් සහ අනෙකුත් නිලධාරීන් පත් කිරීම

1.1.3 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහ අට වන සංශෝධනය

2010 වර්ෂයේදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහ අට වන සංශෝධනය මඟින් කොමිෂන් සභා 07ක් පත් කිරීමට අදාල ක්‍රමවේදයෙහි වෙනසක් සිදු කරන ලදී. අංක 41A(1) දරන ව්‍යවස්ථාවට අයත් I වන උපලේඛනය තුළ සඳහන් කොමිෂන්වල සභාපතිවරුන් හා සාමාජිකයින් අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ඇත. එලෙස පත්වීම් සිදු කිරීමේදී එතුමා විසින් එම උපලේඛනය යටතේම පිහිටුවන ලද පාර්ලිමේන්තු සභාවෙන් නිර්දේශ ලබා ගනු ඇත. මෙම උපලේඛනයෙහි සඳහන් කොමිෂන් සභා අතර මුදල් කොමිෂන් සභාව ද එකකි.

1.1.4 පළාත් පාලන ආයතන හා ඒවායේ නීතිමය පදනම

දැනට ක්‍රියාත්මක රාජ්‍ය පාලන යාන්ත්‍රණය තුළ තුන්වන ස්තරය ලෙස පළාත්පාලන ආයතන දැක්විය හැකිය. ඒවාට පැවරෙන පොදු සේවා විෂය ක්ෂේත්‍ර තුළට මාර්ග, සනීපාරක්ෂාව, කාණු පද්ධති, නිවාස, පුස්තකාල, පොදු උද්‍යාන හා විනෝදාත්මක කටයුතු යනාදිය අන්තර්ගත වේ. සියලුම පළාත් පාලන ආයතන මහජනතාව විසින් තෝරාපත් කරන ලද සාමාජිකයින්ගෙන් සමන්විතවේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයට අනුව පළාත් පාලනය, පළාත් සභා වලට අයත් පවරන ලද විෂයක් ලෙස හඳුනාගෙන ඇත. මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යන නීතිමය ආයතන වර්ග තුන යටතේ පළාත් පාලන කාර්යයන් සිදු කෙරේ. දැනට දිවයින තුළ මහ නගර සභා 23 ක් ද, නගර සභා 41 ක් ද, ප්‍රාදේශීය සභා 271 ක් ද ක්‍රියාත්මක වේ.

පළාත් පාලන ආයතන අධීක්ෂණය කිරීම මෙන්ම විසුරුවා හැරීමේ බලයද පළාත් සභා වෙත පැවරී ඇත. කෙසේ වුවද, ව්‍යවස්ථාමය සංශෝධන මඟින් එක් එක් පළාත් පාලන ආයතන වර්ගවලට, තමනට අදාල පනත් යටතේ බලතල හැසිරවීමට අවකාශ සලසා තිබේ.

- **මහ නගර සභා**

මහ නගර සභාවලට අයත් බලතල පිළිබඳව 1947 අංක 16 දරන මහනගර සභා ආඥාපනත තුළ පැහැදිලිව සඳහන් කොට ඇත. මෙම ආඥා පනතට සංශෝධන 40 කටත් වඩා සිදු කර තිබේ. ආදායම්, ජනගහනය, මාර්ග ජාලය, කාර්මීකරණය හා සන්නිවේදන පහසුකම් යන කරුණු සැලකිල්ලට ගනිමින් "නාගරික ප්‍රදේශයක්" ප්‍රකාශයට පත් කෙරේ.

- **නගර සභා**

1939 අංක 61 දරන නගර සභා ආඥා පනත තුළ නගර සභා වලට අයත් බලතල පැහැදිලිව දක්වා ඇත. මෙම නගර සභා ආඥා පනතට මේ වන විට සංශෝධන 44 ක් පමණ සිදු කොට ඇත.

මහනගර සභා හා නගර සභා වලට පැවරෙන වගකීම් හා කාර්යභාරයන් පහත දැක්වෙන පරිදි වේ.

(අ) අදාල සභාවේ පාලනයට හා කළමනාකරණයට ගැනෙන සියළුම පොදු වීදී සහ විවෘත ස්ථාන පිරිසිදුව පවත්වා ගෙන යෑම හා නඩත්තු කිරීම.

(ආ) සියළුම පෞද්ගලික වීදි නඩත්තු කිරීම, පවිත්‍රව තබා ගැනීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.

(ඇ) ස්වකීය බල ප්‍රදේශයට අයත් වීදි පුළුල් කිරීම, විවෘත ස්ථාන වෙන් වශයෙන් පවත්වා ගෙන යෑම සහ පොදු සේවා වැඩිදියුණු කරලීම වැනි කාර්යයන් මඟින් වර්ධනයට හා සංවර්ධනයට අදාල මනා සුපරීක්ෂණය.

(ඈ) පොදු ජනතාවට මුහුණ දීමට සිදුවන සියළු බාධා හා හිරිහැර අවම මට්ටමකින් තබා ගැනීම.

(ඉ) අදාල අනපනත්වලින් බලය පැවරී ඇති ආකාරයට පොදු ජනතාවගේ පහසුව හා සුහසාධනය සඳහා අවශ්‍ය කරනු ලබන ඕනෑම මහජන උපයෝගීතා සේවාවක් සැපයීම හා පවත්වා ගෙන යෑම.

(ඊ) මහජන සෞඛ්‍යය, සුභසාධනය හා සුවපහසුව වැඩිදියුණු කරන අතර, සනීපාරක්ෂක හා අනෙකුත් පහසුකම් සංවර්ධනය කිරීම.

- **ප්‍රාදේශීය සභා**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත මඟින් ප්‍රාදේශීය සභා ස්ථාපිත කර ඇත. මේ සමඟ මෙයට පෙර පැවති සුළු නගර සභා හා ගම් සභා යන පළාත් පාලන ආයතන අහෝසි විය. ප්‍රාදේශීය සභාවලට ඇති බලතල යටතට මහජන සෞඛ්‍ය සේවා, පොදු උපයෝගීතා සේවා හා පොදු මාර්ග යනාදිය අයත්වන අතර, එකී

පහසුකම් සැපයීම තුළින් අදාල බල ප්‍රදේශයට අයත් මහජනතාවගේ ආරක්ෂාව, සුව පහසුව හා සුභ සාධනය නංවාලීම අපේක්ෂා කෙරේ.

1.1.5 පළාත් පාලන අරමුදල්

පළාත් පාලනයට අදාළ නීති රීති මඟින් එක් එක් පළාත් පාලන ආයතන සඳහා පළාත් පාලන අරමුදල් පිහිටුවා ගැනීමට බලය පවරා ඇත. එමඟින් ස්වකීය මූල්‍ය අවශ්‍යතා සපුරාගත හැකිවන අතර, අදාල අරමුදල් මහ නගර සභා අරමුදල්, නගර සභා අරමුදල් සහ ප්‍රාදේශීය සභා අරමුදල් වශයෙන් වෙන් කොට දැක්විය හැකිය. එමෙන්ම, මෙම ව්‍යවස්ථාමය බලතල යටතේ පළාත් පාලන ආයතනවල අවශ්‍යතා සපුරාගත හැකි වන පරිදි ආදායම් උපයා ගැනීමට ඇති හැකියාව සහතික කොට ඇත.

2. රජයේ අරමුදල් පළාත්වලට මාරු කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව රජය විසින් මුදල් කොමිෂන් සභාවේ උපදෙස් සැලකිල්ලට ගෙන පළාත්වල මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීමට හැකි වන පරිදි ප්‍රමාණවත් අරමුදල් වෙන් කළ යුතු වේ. තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇතිවන අයුරින් පළාත් අතර එම අරමුදල් වෙන් කිරීමේ වගකීම මුදල් කොමිෂන් සභාව සතු වේ. මෙම වගකීම ඉටු කිරීමේදී මුදල් කොමිෂන් සභාව ප්‍රධාන කර්තව්‍යයන් දෙකක නිරත වේ.

(අ) පළාත්වලින් ඉදිරිපත් කරන ලද අවශ්‍යතාවයන් විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව එය පදනම් කරගෙන පළාත් මූල්‍ය අවශ්‍යතාවයන් ඇස්තමේන්තු කිරීම.

මෙහිදී, රාජ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතාවයන් සමග එම ක්‍රියාවලිය අනුගත වන බවට තහවුරු කළ යුතු වේ. අනතුරුව, පළාත් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් අරමුදල් වාර්ෂික අයවැයෙන් ලබාගත හැකි වන පරිදි පළාත් මූල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳව රජයට දැනුම් දෙනු ඇත.

(ආ) ප්‍රාදේශීය විෂමතාවයන් අවම කරලීමේ අරමුණ ලඟා කරගත හැකි පරිදි එකී අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම.

මෙලෙස පළාත් අවශ්‍යතා සපුරාලීම සඳහා වාර්ෂික අයවැයෙන් ලැබෙන මුදල් පළාත් අතර වෙන් කිරීමේදී පළාත් තුළ හා පළාත් අතර පවත්නා විෂමතාවයන් අවම කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව අපේක්ෂා කෙරේ. මෙලෙස පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීමේ ක්‍රියාවලිය තුළ පහත විස්තර කෙරෙන ප්‍රදානයන් භාවිතයට ගැනේ.

2.1 සාමූහික ප්‍රදාන

පළාත් මට්ටමෙන් සිදු කෙරෙන සේවා සැපයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමේ සහ වැඩිදියුණු කිරීමේ අරමුණින් පුනරාවර්තන වියදම් අවශ්‍යතා පියවා ගැනීම පිණිස සාමූහික ප්‍රදාන සැපයෙනු ඇත. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවක සංඛ්‍යාව සඳහා සිදු කළ යුතු ගෙවීම් ප්‍රධාන කොටගත් පළාත් කාර්ය මණ්ඩලයේ වැටුප් සහ වේතන පුනරාවර්තන වියදම්වල ප්‍රධානතම කොටස වේ. ඒ අනුව, අනුමත කරන ලද කාර්ය මණ්ඩල සීමාව තුළ සිටින සත්‍ය කාර්ය මණ්ඩලය සැලකිල්ලට ගෙන වැටුප් හා වේතන තක්සේරු කරනු ලැබේ.

මෙම ප්‍රදාන තුළට ස්වකීය සාමාජිකයින්ගේ දීමනා සහ සේවකයින්ගේ වැටුප් හා වේතන වෙනුවෙන් පළාත් පාලන ආයතනවලට මාරු කරනු ලබන අරමුදල් ප්‍රදානයන් ද අයත් වේ.

2008 සිට 2012 යන කාල සීමාව තුළ නිර්දේශ කරන ලද සහ නිදහස් කරන ලද නිර්දේශිත සාමූහික ප්‍රදාන වෙන් කිරීම්, වගුව 1 හි දක්වා ඇත.

වගුව 1: සාමූහික ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම - 2008 – 2012

රු.මි.

පළාත	2008		2009		2010		2011		2012	
	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම
බස්නාහිර	6,500	6,021	1,923	2,749	6,100	6,100	7,170	8,979	9,011.25	8,893.77
මධ්‍යම	12,950	11,937	12,176	12,487	13,000	13,000	13,270	13,697	13,762.75	13,048.62
දකුණු	10,200	9,607	10,298	10,085	10,500	10,500	11,172	11,760	11,802.99	11,906.59
උතුරු	8,100	7,518	8,349	7,963	8,400	8,700	9,153	9,318	8,556.79	8,500.30
නැගෙනහිර	8,500	8,104	9,891	9,421	10,100	10,100	10,473	10,952	11,385.07	10,737.26
වයඹ	12,500	11,500	12,294	11,868	12,300	12,299	12,656	13,018	12,651.07	11,920.59
උතුරු මැද	6,500	6,068	6,270	6,513	7,300	7,300	7,386	7,596	7,005.42	6,776.02
ඌව	8,250	7,684	7,907	7,807	8,300	8,300	8,897	8,948	9,458.83	9,031.70
සබරගමුව	9,000	8,337	8,893	8,493	9,000	9,000	9,823	10,335	11,243.32	10,736.94
එකතුව	**82,500**	**76,773**	**77,999**	**77,386**	**85,000**	**85,299**	**90,000**	**94,602**	**94,877.48**	**91,551.79**

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාරය

2.2 උපමාන පාදක ප්‍රදාන

ප්‍රාදේශීය විෂමතා අවම වන පරිදි පළාත්වල වෙසෙන ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය කරනු ලබන ප්‍රාග්ධන වියදම්, උපමාන පාදක ප්‍රදාන මගින් සැපයේ. මෙම අරමුදල් භාවිතයට ගැනීමේදී පළාතේ අභිමතය පරිදි සංවර්ධන වැඩසටහන්වලට වැය කිරීමේ හැකියාව පළාත් සතුව පවතී. කෙසේ වුවද, මෙම අරමුදල් ද වෙන් කිරීමේදී මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2011 ජූලි 26 දිනැති FC/PSDG&CBG/CIRCULAR/2011/1 අංක දරන චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශවලට අනුගත වීම අවශ්‍ය කෙරේ.

2008 සිට 2012 කාල පරිච්ඡේදය තුළ උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම් හා නිදහස් කිරීම් වගුව 2 මගින් දක්වා ඇත.

වගුව 2: උපමාන පාදක ප්‍රදාන වෙන් කිරීම සහ නිදහස් කිරීම - 2008 – 2012

රු.මි.

පළාත	2008		2009		2010		2011		2012	
	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම
බස්නාහිර	1,000	127	510	375	450	383	400	660	427	180.41
මධ්‍යම	613	335	446	306	410	308	375	337	400	218.40
දකුණු	656	310	426	230	350	298	325	292	347	189.46
උතුරු	280	185	332	241	300	255	275	247	294	160.52
නැගෙනහිර	370	341	382	197	325	276	250	230	267	145.78
වයඹ	525	301	370	272	300	255	300	270	320	174.72
උතුරු මැද	279	202	297	137	260	260	275	1,277	*1,616.63	1420.0
ඌව	292	185	373	206	300	255	300	240	320	174.72
සබරගමුව	485	317	416	311	380	323	335	301	357	194.92
එකතුව	**4,500**	**2,304**	**3,550**	**2,276**	**3,075**	**2,612**	**2,835**	**3,855**	**4,348.63**	**2,858.93**

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාරය
**පරිපූරක ඇස්තමේන්තු සමග*

2.3 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කරනු ලබන්නේ පළාත් මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන ව්‍යාපෘති සඳහාය. මෙහිදී, ජනතාවගේ ජීවන මට්ටම වැඩිදියුණු කිරීමේ අරමුණින් බලය පවරන ලද විෂයන්ට අදාල යටිතල පහසුකම් සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. පළාත් විසින් ස්වකීය සංවර්ධන සැලසුම් ඉදිරිපත් කිරීමේදී, එම සැලසුම් පළාත් අවශ්‍යතාවයන් සහ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සමඟ ගැලපිය යුතු බවට මුදල් කොමිෂන් සභාව සහ අදාල පළාත් බලධාරීන් විසින් සාකච්ඡාමය සම්මුතියකට එළඹෙනු ඇත. එක් එක් ආයෝජනයන් වෙනුවෙන් මිනිය හැකි ප්‍රතිඵල (නිමැවුම, ප්‍රතිවිපාක සහ බලපෑම) හඳනාගත යුතු අතර, පූර්වයෙන් නිර්වචනය කරන ලද දර්ශක පදනම් කරගෙන වරින් වර මෙහෙයුම් හා ඇගයුම් කාර්යය සිදු කළ යුතුය. මෙහිදී, සියලුම පළාත් අධිකාරීන් විසින් ප්‍රතිඵල මත පදනම්ව මෙහෙයුම් හා ඇගයුම් සිදු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් හඳුන්වාදෙන ලද ආකෘති පත්‍ර භාවිතා කළ යුතු වේ.

- එක් එක් පළාත මගින් සකස් කරන ලද ආයතනික ප්‍රතිඵල රාමුව පදනම් කරගෙන 2013 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කරන ලදී. මෙම ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය අනුව අරමුදල් වෙන් කෙරෙනුයේ ආයතන පදනම් කරගෙනය. ඒ අනුව, සියලුම පළාත් ආයතන විසින් ස්වකීය දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක ලඟා කර ගැනීම පිණිස මෙම අරමුදල් භාවිතා කළ යුතු අතර, මෙහිදී පූර්වයෙන් නිර්වචනය කරන ලද නිමැවුම් සහ ප්‍රතිඵල දර්ශක පදනම් කරගත යුතුය. එක් එක් පළාත් ආයතන විසින් තම ප්‍රතිඵල රාමු පිළියෙල කරන ලද අතර, පළාත් විසින් ඒවා ඒකරාශි කොට 2013–2017 සඳහා වූ මධ්‍යකාලීන සංවර්ධන සැලසුම් පිළියෙල කොට ඇත. මෙම මධ්‍යකාලීන සංවර්ධන සැලසුමෙහි දැක්වෙන ප්‍රමුඛතාවයන් සහ ආයතනවලට වෙන් කරන ලද අරමුදල් සැලකිල්ලට ගෙන ආයතන මට්ටමේ වාර්ෂික සංවර්ධන සැලසුම් ඉදිරිපත් කළ යුතු වේ. මුදල් කොමිෂන් සභාව විසින් පළාත් නිලධාරීන් සඳහා අදාල පුහුණුව සපයා ඇති අතර, ප්‍රතිඵල පාදක සැලසුම් සැකසීමේදී භාවිතයට ගත යුතු ආකෘති පත්‍ර ද හඳුන්වාදී ඇත.

අරමුදල් සැපයීම පිණිස 2013 වර්ෂය සඳහා හඳුනාගනු ලැබූ ආයතන / අංශ පහත දක්වා ඇත.

1. මාර්ග
    1.1. පළාත් සහා මාර්ග පුනරුත්ථාපනය
    1.2. වතු මාර්ග
2. ප්‍රවාහන
3. ඉඩම්
4. අධ්‍යාපන
5. සෞඛ්‍යය (බටහිර වෛද්‍ය)
6. දේශීය වෛද්‍ය
7. ක්‍රීඩා
8. පළාත් පාලන
    8.1. පළාත් පාලන මාර්ග
    8.2. පළාත් පාලන සේවා
    8.3. අපද්‍රව්‍ය කළමනාකරණය
9. පරිවාස හා ළමාරක්ෂක
10. සමාජ සේවා
11. නිවාස
12. සංස්කෘතික කටයුතු
13. කෘෂිකර්ම
14. පශු සම්පත්
15. මිරිදිය ධීවර
16. වාරිමාර්ග
17. ග්‍රාමීය යටිතල පහසුකම්
18. කුඩා කර්මාන්ත
19. ග්‍රාමීය විකල්ප බලශක්ති
20. සමුපකාර සංවර්ධනය
21. සංචාරක

- **තුලිත ප්‍රාදේශීය සංවර්ධනය සඳහා විශේෂ ව්‍යාපෘති**

ප්‍රාදේශීය විෂමතා අවම කරලීමේ අරමුණින් පළාත් විසින් හඳුනාගනු ලැබූ මධ්‍ය පරිමාණයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තුලිත සංවර්ධනය යටතේ විශේෂ අරමුදල් ප්‍රමාණයක් වෙන් කොට තිබේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර මුදල් කොමිෂන් සභාවේ එකඟතාවය ලබාගත යුතු වේ. තවද, මෙම ව්‍යාපෘති අවුරුදු 1 සිට 3 දක්වා කාල පරිච්ඡේදයක් ආවරණය වන පරිදි සකස් කළ යුතු වේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් අදාල ප්‍රදේශයන් තුළ එකතු කළ වටිනාකම වැඩි කිරීම, දරිද්‍රතාවය අඩු කිරීම සහ රැකියා උත්පාදනය යන ක්ෂේත්‍රයන්හි ධනාත්මක බලපෑමක් සිදුවීම අපේක්ෂා කෙරේ.

- **නම්‍යශීලී ප්‍රතිපාදන**

මෙම අරමුදල් විශේෂය මගින් "පරතරය පියවීමක්" අපේක්ෂා කරනු ලබන අතර, එමඟින් මුල් සැලැස්මෙහි ඇතුළත් කිරීමට නොහැකි වූ හදිසි අවශ්‍යතාවයන් පිළිබඳව අවධානය යොමු කිරීමට හැකිය.

- **ජාතික මට්ටමෙන් සැලසුම් කොට එකඟත්වයට පැමිණි විදේශාධාර හා දේශීය අරමුදල් යොදවා ක්‍රියාත්මක වන ව්‍යාපෘති**

ජාතික මට්ටමෙන් සැලසුම් කොට එකඟතාවයකට පැමිණි විශේෂ ව්‍යාපෘති පළාත් අයවැය තුළ අන්තර්ගත කිරීම මෙහි පරමාර්ථයයි. මෙම ව්‍යාපෘති සඳහා ද්විපාර්ශ්වික හා බහුපාර්ශ්වික ආධාර ආයතනවලින් මෙන්ම ඒකාබද්ධ අරමුදලෙන් ද අරමුදල් සැපයේ.

2008 – 2012 කාලපරිච්ඡේදය තුළ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන වෙන් කිරීම් හා නිදහස් කිරීම් පිළිබඳ විස්තර, වගුව 3 මගින් දක්වා ඇත.

වගුව 3: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ වෙන් කිරීම සහ නිදහස් කිරීම - 2008 - 2012

රු.මි.

පළාත	2008		2009		2010		2011		2012	
	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම	වෙන් කිරීම	නිදහස් කිරීම
බස්නාහිර	2,435	1,050	1,726	1,567	1,755	1,737	1,736	1,380	1,990	491
මධ්‍යම	2,045	1,368	2,572	1,606	2,145	1,895	2,490	1,369	3,013	856.88
දකුණු	2,037	1,293	1,727	1,102	1,773	1,656	1,535	1,283	1,818	813.85
උතුරු	1,469	764	1,877	1,946	2,807	2,365	3,068	1,306	3,568	947.37
නැගෙනහිර	1,641	747	4,702	1,202	3,273	1,730	5,079	1,135	3,917	1,108.25
වයඹ	2,018	1,332	1,530	1,056	1,633	1,613	1,542	1,265	1,836	816.85
උතුරු මැද	1,930	1,222	1,701	1,202	2,350	1,956	2,808	1,141	2,806.5	717.72
ඌව	1,917	916	2,338	1,173	2,007	1,888	3,169	1,210	3,117	805.81
සබරගමුව	2,008	1,177	2,259	1,143	1,737	1,564	2,028	1,110	2,648	709.66
එකතුව	**17,500**	**9,872**	**20,431**	**11,998**	**19,480**	**16,403**	**23,455**	**11,199**	**24,713.5**	**7,267.39**

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව හා මහා භාණ්ඩාගාරය
සටහන: සංවර්ධන ව්‍යාපෘති ඇතුළත්ව

3. පළාත් අතර සම්පත් බෙදා වෙන් කිරීමේදී භාවිතා කරන ලද උපමාන

ව්‍යවස්ථාවට අනුව පළාත් සහා හරහා රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ඇති කරලීම සඳහා අවශ්‍ය මූලධර්ම සැකසීමේ වගකීම මුදල් කොමිෂන් සභාව සතු වේ. මෙම අරමුණ ලඟා කර ගැනීමේ අදහසත්, පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීමේ දී, කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ප්‍රධාන උපමාන සැලකිල්ලට ගනු ලැබේ.

1. එක් එක් පළාතේ ජනගහනය
2. එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම
3. පළාත් අතර පවත්නා සමාජ - ආර්ථික විෂමතාවන් අඩු කිරීමේ අවශ්‍යතාවය

පළාත් අතර පවත්නා ප්‍රාදේශීය සමාජ - ආර්ථික විෂමතාවන් අඩු කිරීම සහතික කරලනු වස් මුදල් කොමිෂන්සභාව පුළුල් විමසුම් අභ්‍යාසයක නියැලේ. මෙම අභ්‍යාසයේදී පහත දැක්වෙන ප්‍රධාන සාර්ව දර්ශක භාවිතයට ගනු ලබයි.

- පළාත් දළ දේශීය නිෂ්පාදිතය
- දරිද්‍රතා අනුපාතය
- පළාත් ඒක පුද්ගල ආදායම
- දළ ජාතික නිෂ්පාදිතයේ පළාත් දායකත්වය
- පළාත්වල ආර්ථික අංශයන්ගේ දළ දායකත්වය
- වාර්ෂික පළාත් වර්ධන අනුපාතය
- පළාත්වල ජනගහන දායකත්වය

සම්පත් බෙදා වෙන් කරලීමේ ක්‍රියාවලියේදී මහින්ද චින්තන ඉදිරි දැක්ම : රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙහි දැක්වෙන ප්‍රතිපත්ති හා උපාය මාර්ග කෙරෙහි අනුගත වන අතර, ''මහජනතාවගේ අවම ශුභ සාධන මට්ටම'' පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් ද සැලකිලිමත් වේ. විදේශ ආධාර හා දේශීය අරමුදල් භාවිතයෙන් ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් හරහා පළාත් අතර සම්පත් බෙදී යන ආකාරය ද ප්‍රාග්ධන අරමුදල් වෙන් කිරීමේදී අවධානයට ලක් කෙරේ.

සම්පත් බෙදා වෙන් කිරීමේ ක්‍රියාවලියේ දී කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගනු ලබන සමහර තෝරාගත් සාර්ව දර්ශක පිළිබඳ විස්තරයක් පහත දැක්වේ.

- **පළාත් දළ දේශීය නිෂ්පාදිතය**

පළාත් අතර විෂමතාවයන් අඩු කිරීමෙහිලා වූ උපාය මාර්ග හඳුනා ගැනීමේදී ද භාවිතා කෙරෙන ''ප්‍රාදේශීය වර්ධනය'' පිළිබඳ සංකල්පය හා බැඳුණු වැදගත් සංරචකයක් ලෙස, කිසියම් කාල පරිච්ඡේදයක් තුළ පළාත් දළ දේශීය නිෂ්පාදිතයේ හැසිරීම සම්බන්ධයෙන් තක්සේරුවක නිරත වීම පෙන්වා දිය හැකිය. තවද, පළාත් දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ විශ්ලේෂණය කිරීම මගින්, තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් මූලික කොට ගත් ප්‍රමුඛ පරාසයන් තක්සේරු කිරීම සඳහා වූ වැදගත් පදනමක් සැපයේ. මුදල් කොමිෂන් සභාව, මෙම තක්සේරුවේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පළාත් දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා ලේඛන යොදා ගනී.

වගුව 4: දළ ජාතික නිෂ්පාදිතයේ පළාත් දායකත්වය (%)

පළාත	2007	2008	2009	2010	2011
බස්නාහිර	46.5	45.4	45.8	44.8	44.4
මධ්‍යම	9.6	9.8	9.8	10.0	9.8
දකුණු	10.5	10.5	10.5	10.7	11.1
උතුරු	2.9	3.2	3.2	3.4	3.7
වයඹ	9.9	9.9	9.6	9.5	10.0
උතුරු මැද	4.0	4.7	4.6	4.8	4.6
ඌව	4.9	4.5	4.5	4.5	4.5
සබරගමුව	6.4	6.4	6.1	6.3	6.2
නැගෙනහිර	5.2	5.6	5.8	6.0	5.7
එකතුව	100	100	100	100	100

මූලාශ්‍රය: මහ බැංකුව

පළාත් දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය විශ්ලේෂණය කිරීමේදී 2009, 2010 හා 2011 යන වර්ෂවල කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා යන ප්‍රධාන ආර්ථික අංශ, පළාත් ආර්ථිකයන් තුළ වෙනස් වූ කාර්යභාරයක් ඉටු කර ඇති බව නිරීක්ෂණය කළ හැකිය. පළාත්වල ආර්ථික අංශයන්ගේ දායකත්වය පිළිබඳ විස්තර වගු අංක 05, 06 හා 07 මගින් විස්තර කර ඇත.

වගුව 5: අංශ අනුව පළාත් දළ ජාතික නිෂ්පාදිතයට සිදු කරන ලද දායකත්වය - 2009

පළාත	කෘෂිකාර්මික	%	කාර්මික	%	සේවා	%	ද.ජා.නි.	%
බස්නාහිර	60,955	3	732,406	33	1,422,985	64	2,216,346	100
දකුණු	88,036	17	163,563	32	257,453	51	509,052	100
සබරගමුව	58,642	20	75,630	26	160,387	54	294,659	100
මධ්‍යම	90,700	19	128,536	27	254,180	54	473,416	100
ඌව	67,263	31	44,750	20	107,280	49	219,293	100
නැගෙනහිර	63,879	23	93,667	34	121,817	44	279,363	100
වයඹ	87,734	19	137,572	30	240,735	52	466,041	100
උතුරු මැද	67,902	31	44,043	20	109,348	49	221,293	100
උතුරු	28,582	18	14,534	9	112,711	72	155,827	100
ශ්‍රී ලංකාව	**613,693**	**13**	**1,434,701**	**30**	**2,786,896**	**58**	**4,835,290**	**100**

මූලාශ්‍රය: මහ බැංකුව

වගුව 6: අංශ අනුව පළාත් දළ ජාතික නිෂ්පාදිතයට සිදු කරන ලද දායකත්වය - 2010

පළාත	කෘෂිකාර්මික	%	කාර්මික	%	සේවා	%	ද.ජා.නි.	%
බස්නාහිර	76,083	3	804,394	32	1,644,764	65	2,525,241	100
දකුණු	100,336	17	208,954	35	291,032	48	600,322	100
සබරගමුව	76,792	22	85,486	24	188,776	54	351,054	100
මධ්‍යම	101,795	18	161,048	29	295,641	53	558,484	100
ඌව	82,243	33	48,046	19	121,659	48	251,948	100
නැගෙනහිර	74,038	22	97,202	29	160,364	48	331,604	100
වයඹ	96,620	18	163,173	31	267,888	51	527,681	100
උතුරු මැද	79,381	30	53,813	20	133,016	50	266,210	100
උතුරු	30,622	16	27,151	14	133,786	70	191,559	100
ශ්‍රී ලංකාව	**717,910**	**13**	**1,649,267**	**29**	**3,236,926**	**58**	**5,604,103**	**100**

මූලාශ්‍රය: මහ බැංකුව

වගුව 7: අංශ අනුව පළාත් දළ ජාතික නිෂ්පාදිතයට සිදු කරන ලද දායකත්වය - 2011

පළාත	කෘෂිකාර්මික	%	කාර්මික	%	සේවා	%	ද.ජා.නි.	%
බස්නාහිර	93,308	3	948,994	33	1,862,858	64	2,905,159	100
දකුණු	112,346	15	254,228	35	360,422	50	726,996	100
සබරගමුව	85,675	21	103,327	25	217,564	54	406,566	100
මධ්‍යම	113,245	18	170,503	27	360,412	56	644,159	100
ඌව	88,073	30	57,167	20	147,223	50	292,463	100
නැගෙනහිර	60,670	16	118,608	32	196,011	52	375,288	100
වයඹ	110,615	17	193,791	30	347,729	53	652,136	100
උතුරු මැද	70,062	23	65,036	22	164,945	55	300,042	100
උතුරු	58,464	24	45,005	19	137,730	57	241,200	100
ශ්‍රී ලංකාව	**792,458**	**12**	**1,956,658**	**29**	**3,794,893**	**58**	**6,544,009**	**100**

මූලාශ්‍රය: මහ බැංකුව

පසුගිය වර්ෂ කිහිපය තුළ රටෙහි ආර්ථිකය වර්ධනය වෙමින් පැවති තත්ත්වය තුළ (දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 6% ක පමණ), නිරීක්ෂණයට ලක් කළ හැකි වැදගත් ප්‍රපංචයන් වනුයේ කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා යන ප්‍රධාන අංශ තුනෙහි වර්ධන කාර්ය සාධනය විවිධාකාර වූ බවයි. මෙම අංශ අතුරින් කෘෂිකර්ම අංශයේ වර්ධනය වඩා උච්ඡාවචනයට ලක් වූ අතර, දළ ජාතික නිෂ්පාදිතයට අඩුම දායකත්වය සපයා ඇත. කර්මාන්ත අංශයේ වර්ධනය බොහෝ දුරට ස්ථාවර මට්ටමක පැවතිය ද සේවා අංශයේ වර්ධන වේගය වේගයෙන් ඉහළ ගොස් ඇත. කෘෂිකර්ම අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට වූ දායකත්වය 13% කට වඩා අඩු වුවද, ජනගහනයෙන් විශාල ප්‍රතිශතයක්, එනම් 48% ක් පමණ ඍජුව හා වක්‍රව කෘෂිකර්ම ක්ෂේත්‍රයේ රැකියා මත රඳා පවත්නා බව පෙනේ.

පළාත්වල තත්ත්වය පිළිබඳව විමසීමෙන් බලන විට පෙනී යන්නේ 2011 වර්ෂයේදී ඌව, උතුරු මැද හා උතුරු යන පළාත්වල දළ දේශීය නිෂ්පාදිතයන් ආසන්න වශයෙන් රු.බිලියන 300ක් පමණ වූ අතර, අනෙකුත් පළාත්වලට සාපේක්ෂව එය පහළ අගයන් බවයි. කෙසේ වුවද, පශ්චාද් ගැටුම් සමයේදී වැඩිදියුණු වූ යටිතල පහසුකම් හේතු කොට ගෙන, නැගෙනහිර පළාතේ දළ දේශීය නිෂ්පාදිතය මෙම සංඛ්‍යාව ඉක්මවා ගොස් ඇති බව පෙනී යයි.

2009 – 2011 කාලපරිච්ඡේදය තුළ සියලුම පළාත්වල සේවා අංශයේ වටිනාකම ඉහළ ගොස් ඇති බව නිරීක්ෂණය කළ හැකි අතර, 2010 වර්ෂයේ දී මධ්‍යම පළාතේ කෘෂිකර්ම අංශය ශක්තිමත් වර්ධනයක් පෙන්වා ඇත. ඉතා පැහැදිලිව පෙනී යන පරිදි, බස්නාහිර පළාතේ සේවා අංශයීය දායකත්වය ප්‍රධාන ලෙස අඛණ්ඩව පවත්නා අතර, එය කෘෂිකර්ම අංශය හා සසඳන විට විසි ගුණයක් බව පෙනී යයි. 2011 වර්ෂය තුළ,

ඌව, උතුරු මැද හා උතුරු යන පළාත් හැර සෙසු පළාත්වල, පළාත් දළ දේශීය නිෂ්පාදිතයට කර්මාන්ත අංශයේ දායකත්වය දෙවන ස්ථානය ලෙස කැපී පෙනේ.

- **දරිද්‍රතා අනුපාතය**

එක්සත් ජාතීන්ගේ සහස්‍ර සංවර්ධන අරමුණුවල පළමු වන අභිමතාර්ථය වන "දරිද්‍රතාවය පිටුදැකීම" යටතේ, 2015 වන විට දරිද්‍රතාවය අඩකින් අඩු කිරීම සඳහා 2000 වර්ෂයේදී ලෝකයේ සියලුම රටවල් පාහේ එකඟතාවයකට එළඹීන. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දැනටමත් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. 1990/91 වර්ෂයේ පැවති 26% ක් වූ දරිද්‍රතා අනුපාතය 2009/10 වන විට 8.9% දක්වා පහත වැටී ඇති අතර, එය ඉලක්ක වර්ෂයටත් පෙර දරිද්‍රතාවය තුනෙන් දෙකකින් පමණ අඩු කර ගැනීමක් බව පෙනී යයි. 2013 වාර්ෂික අයවැය කථාව සමඟ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ මධ්‍යකාලීන සංවර්ධන සැලැස්මට අනුව, 2016 වන විට දිළිඳු බවින් තොර මධ්‍යම ආදායම් ආර්ථිකයක් ඇති කිරීමට හා සහස්‍ර සංවර්ධන අරමුණු අභිබවා යෑමට ඉලක්ක කර ඇත. මෙම සන්දර්භය තුළ පළාත් සංවර්ධනය තුළ ද, දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වූ ප්‍රමුඛතාවය අඛණ්ඩවපවත්වා ගෙන යා යුතු වේ. රජයේ දරිද්‍රතාවය පිටුදැකීමේ උපාය මාර්ගය තුළට එය අන්තර්ගත කළ යුතු අතර, අනුපූරක බවට ද පත් කළ යුතු වේ. මේ සම්බන්ධයෙන් සමස්තයක් ලෙස කාර්ය සාධනයක් පෙන්නුම් කළ ද, පළාත් හා දිස්ත්‍රික්ක අතර සැලකිය යුතු තරමේ ප්‍රාදේශීය විෂමතාවන් පවතී. 2009/2010 වර්ෂයේදී, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කුටුම්භ ආදායම් - වියදම් සමීක්ෂණයෙන් හෙළිදරව් වන පරිදි අනෙකුත් පළාත් හා සසඳන විට නැගෙනහිර පළාත තුළ ඉහළ දරිද්‍රතා මට්ටමක් දක්නට ලැබේ. බස්නාහිර හා උතුරු මැද පළාත් හැර අනෙකුත් පළාත්වල දරිද්‍රතා මට්ටම ජාතික මට්ටමේ සාමාන්‍යය වන 8.9% ට වඩා ඉහළ අගයක් ගනී.

පසුගිය වර්ෂ 20 ක කාලය තුළ සියලුම පළාත් දරිද්‍රතා අනුපාතවල කැපී පෙනෙන අඩුවීමක් පෙන්නුම් කර ඇත. මෙම කාලය තුළ දරිද්‍රතා අනුපාතයේ ඉහළම අඩුවීම මධ්‍යම හා උතුරු මැද පළාත්වල දැකිය හැකි අතර, අවම අඩුවීම වාර්තා වන්නේ ඌව පළාතෙනි. පසුගිය වර්ෂ 20ක කාලය තුළ පළාත් අනුව දරිද්‍රතා අනුපාතයේ උපනතීන් පිළිබඳ වගුව 8 මගින් විස්තර කර ඇත.

වගුව 8: පළාත් අනුව සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ 1 ට අදාල කාර්ය සාධනය

පළාත	දරිද්‍රතා දර්ශකය					සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ 1 ඉලක්ක 2015 (දරිද්‍රතා දර්ශකය අනුව)
	සමීක්ෂණ කාල පරිච්ඡේදය					
	1990/91	1995/96	2002	2006/07	2009/10	
බස්නාහිර	19.1	16.3	10.8	8.2	4.2	9.55
මධ්‍යම	30.7	36.2	25.1	22.3	9.7	15.35
දකුණු	30.2	32.6	27.8	13.8	9.8	15.1
උතුරු	*	*	*	*	12.8	
වයඹ	25.8	27.7	27.3	14.6	11.3	12.9
උතුරු මැද	24.5	24.7	21.5	14.2	5.7	12.25
ඌව	31.9	46.7	37.2	27.6	13.7	15.95
සබරගමුව	31.0	41.7	33.6	24.2	10.6	15.5
නැගෙනහිර	*	*	*	10.8	14.8	
ශ්‍රී ලංකාව	26.1	28.8	22.7	15.2	8.9	13.05

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණ වාර්තා *1990/91, 1995/96, 2002, 2006/07, 2009/10*

*සටහන: *දත්ත නොමැත*

දරිද්‍රතාවය පිළිබඳව ඉහත දැක්වෙන උපනතීන් සැලකිල්ලට ගත් විට, අඩු සංවර්ධිත ප්‍රදේශවල දරිද්‍රතාවය අධික ස්ථාන කෙරෙහි වැඩි අවධානයක් දැක්වීමට හා සංවර්ධිත ප්‍රදේශ වලින් පිටතට වැඩිපුර සම්පත් හැරවීමක් සිදු කළ යුතු බවට නිර්දේශ කළ හැකිය. මේ අනුව, කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ආයෝජන උපායමාර්ගයෙහි ප්‍රමුඛ ක්ෂේත්‍රයක් වනුයේ, දිළිඳුකම අඩු කිරීමෙහි ලා හඳුනාගත් ස්ථාන කෙරෙහි වැඩි අවධානයක් යොමු කරලීමයි. මෙම උපායමාර්ගය තුළ ප්‍රධාන වශයෙන් අන්තර්ගත වනුයේ තිරසාර

කෘෂිකර්මය, විකල්ප ජීවන මාර්ග හරහා රැකියා උත්පාදනය හා ග්‍රාමීය ප්‍රදේශවල මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමයි. ස්වකීය සංවර්ධන සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මෙම උපායමාර්ග අනුගමනය කරන ලෙස මුදල් කොමිෂන් සභාව විසින් පළාත් අධිකාරීන් උනන්දු කරවනු ලැබේ.

- **මධ්‍යනය ඒක පුද්ගල ආදායම**

සමාජයක් තුළ ක්‍රයශක්තිය මැනීමට භාවිතා කරනු ලබන දළ දර්ශකයක් ලෙස මධ්‍යනය ඒක පුද්ගල ආදායම සැලකිය හැකි වුවද, සමාජයේ විවිධ ස්ථර අතර පවත්නා ආදායම් ව්‍යාප්ති රටාව පිළිබඳව එමඟින් අදහසක් නොසැපයේ. ක්‍රයශක්තිය තුළින් දරිද්‍රතාවය හා ජනතාවගේ ජීවන තත්ත්වය වැනි සමාජ - ආර්ථික තත්ත්වයන් පිළිබිඹු කෙරේ. 2009/2010 වර්ෂයේ දී ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලද කුටුම්භ ආදායම් - වියදම් සමීක්ෂණය පදනම් කොට ගෙන මධ්‍යනය ඒක පුද්ගල ආදායම පිළිබඳ නවතම ඇස්තමේන්තු සකසා ඇත. පළාත් අනුව ඒක පුද්ගල ආදායම පිළිබඳ තොරතුරු වගුව 9 මගින් පෙන්නුම් කෙරේ.

වගුව 9: පළාත් අනුව මධ්‍යනය ඒක පුද්ගල ආදායම - 2009/10

පළාත	මධ්‍යනය ඒක පුද්ගල ආදායම (රු.මි.)
බස්නාහිර	11,561
මධ්‍යම	8,040
දකුණු	8,035
උතුරු	5,515
නැගෙනහිර	5,663
වයඹ	9,280
උතුරු මැද	9,132
ඌව	7,343
සබරගමුව	9,132
ශ්‍රී ලංකාව	**9,104**

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වියදම් සමීක්ෂණ වාර්තාව *2009/10*

ඉහත වගුවෙන් නිරීක්ෂණය වන පරිදි මධ්‍යනය ඒක පුද්ගල ආදායම සම්බන්ධයෙන් බස්නාහිර පළාත හා අනෙකුත් පළාත් අතර පැහැදිලි විෂමතාවයක් පවතී. අදාල වර්ෂය තුළ උතුරු හා නැගෙනහිර යන පළාත්වල අවම මධ්‍යනය ඒක පුද්ගල ආදායම දැකිය හැකි වුවද, මෙම පළාත්වල පශ්චාද් ගැටුම් සමයේදී සිදු කරන ලද සංවර්ධන කාර්යයන් නිසා වර්තමාන තත්ත්වය වෙනස් වීමට පුළුවන.

- **මූලික යටිතල පහසුකම් සඳහා ප්‍රවේශය**

සම්පත් බෙදා වෙන් කිරීම පිළිබඳ අභ්‍යාසයේදී, මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රධාන යටිතල පහසුකම් වර්ග දෙකක් කෙරෙහි අවධානය යොමු කොට ඇත. එනම්, කුටුම්භ මට්ටමෙන් විදුලිබල සැපයුම හා පළාත්වල තිබෙන මාර්ග ප්‍රමාණයයි.

යටිතල පහසුකම්වල මට්ටම හා ජනතා ශුභ සාධනය විදහා දක්වන වැදගත් දර්ශකයක් ලෙස නිවෙස්වලට විදුලි බලය තිබීම සැලකිය හැකිය. මිනිසුන් පදිංචි වී සිටින නිවාස ඇතුරින් ප්‍රධාන ආලෝක සැපයුම් මූලාශ්‍රය ලෙස විදුලිය සම්බන්ධතා තිබෙන නිවාසවල සංඛ්‍යාව, ප්‍රතිශතයක් වශයෙන් වගුව 10 තුළ දක්වා ඇත.

වගුව 10 : ප්‍රධාන ආලෝක සැපයුම් මූලාශ්‍රයක් ලෙස විදුලිබලය භාවිතා කරනු ලබන කුටුම්භයන්ගේ ප්‍රතිශතය

පළාත	දිස්ත්‍රික්කය	2001 සංගණනය	2011 සංගණනය
බස්නාහිර	කොළඹ	85.9	97.9
	ගම්පහ	82.9	96.6
	කළුතර	71.8	94.1
මධ්‍යම	මහනුවර	70.4	93
	මාතලේ	50.5	84.9
	නුවරඑළිය	53.7	88.9
දකුණ	ගාල්ල	72.6	94.1
	මාතර	71.5	94.1
	හම්බන්තොට	48.6	89.3
උතුර	යාපනය	නැත	73.3
	මන්නාරම	නැත	63.9
	වව්නියාව	නැත	71
	මුලතිව්	නැත	23.6
	කිලිනොච්චිය	නැත	10.2
නැගෙනහිර	මඩකලපුව	නැත	67.5
	අම්පාර	49.8	81.9
	ත්‍රිකුණාමලය	නැත	78.1
වයඹ	කුරුණෑගල	51	86
	පුත්තලම	52.3	83.9
උතුරු මැද	අනුරාධපුරය	48.6	83.4
	පොළොන්නරුව	45.1	83.6
ඌව	බදුල්ල	58.9	86.5
	මොණරාගල	31.6	70.6
සබරගමුව	රත්නපුර	45.1	83.5
	කෑගල්ල	56.6	88.7

මූලාශ්‍රය: ජන හා නිවාස සංගණනය - 2001 සහ 2011

2001–2011 කාලපරිච්ඡේදය තුළ සියලුම පළාත්වල කුටුම්භයනට විදුලිබලය සැපයීම විශාල වශයෙන් ප්‍රගතියක් පෙන්නුම් කරයි. මෑත වර්ෂවලදී ජනතා අයිතියට පත් කරන ලද විශාල සංවර්ධන යෝජනා ක්‍රම මෙයට හේතුව ලෙස දැක්විය හැකිය. ඉහත වගුවෙන් පෙන්වනු ලබන ආකාරයට, 2011 වර්ෂය තුළ ප්‍රධාන ආලෝක සැපයුම් මූලාශ්‍රයක් ලෙස විදුලිබල පහසුකම් තිබෙන වැඩිම කුටුම්භ සංඛ්‍යාව වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙනි (97.9%). විදුලිබල සැපයුම සහිත කුටුම්භ 90%කට වඩා වාර්තා වන අනෙකුත් දිස්ත්‍රික්ක වනුයේ ගම්පහ, කළුතර, ගාල්ල, මාතර සහ මහනුවරයි. මෑත වර්ෂවලදී උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වූ විශේෂ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් යටතේ දුෂ්කර ප්‍රදේශවලට විදුලිබලය ලබාදීම ඉතා කැපී පෙනෙන සිද්ධියකි.

සී සහ ඩී ශ්‍රේණි වලට අයත් මාර්ග, පළාත් සභාවලට පවරා ඇති අතර, ඒවායේ සංවර්ධන හා නඩත්තු කටයුතු පළාත් මාර්ග අධිකාරීන්ගේ වගකීමක් වේ. මාර්ගවලට ඇති ප්‍රවේශය ඉතා වැදගත් සාධකයක් ලෙස සැලකෙන හෙයින්, අරමුදල් බෙදා වෙන් කිරීමේ ක්‍රියාවලියේ දී පළාත් මාර්ගවල දුර ප්‍රමාණය දර්ශකයක් ලෙස භාවිතා කෙරේ. පළාත්වල දැනට පවත්නා මාර්ගවල දුර ප්‍රමාණය වගුව 11 මගින් පෙන්නුම් කෙරේ.

වගුව **11 : සී හා ඩී මාර්ගවල ප්‍රමාණය**

පළාත	මාර්ගවල ප්‍රමාණය (කි.මී.)	
	සී ශ්‍රේණිය	ඩී ශ්‍රේණිය
බස්නාහිර	998	954
මධ්‍යම	1666	578
දකුණ	1026	816
උතුර	1524	443
නැගෙනහිර	726	372
වයඹ	1091	1155
උතුරු මැද	1427	623
ඌව	1521	216
සබරගමුව	1247	1097

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව 2011

3.1 සම්පත් බෙදා වෙන් කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදය

උපමාන පාදක ප්‍රදාන හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අරමුදල් බෙදා වෙන් කිරීමේදී, මුදල් කොමිෂන් සභාව විසින් වැඩිදියුණු කරන ලද ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. 2013 වර්ෂය සඳහා යොදා ගනු ලැබූ නව ක්‍රමවේදය (සූත්‍රය) පහත විස්තර කර ඇත.

මූලික සංරචක විශ්ලේෂණය (Principal Component Analysis) නමින් හඳුන්වනු ලබන බහු විචල්‍යමය සංඛ්‍යාත්මක ශිල්ප ක්‍රමයක් (Multivariate Statistical Technique) භාවිතා කරමින් සියලුම පළාත් සඳහා "සංයෝජිත දර්ශක" ගණනය කරන ලදී. මෙහිදී, ජනතාවගේ ජීවන මට්ටම කෙරෙහි ඉතා කිට්ටුවෙන් බැඳී පවත්නා විචල්‍යයන් කිහිපයක් ඒ සඳහා යොදා ගැණින. සම්පත් බෙදා වෙන් කරලීමේ ක්‍රමවේදය හෙවත් සූත්‍රය භාවිතයට ගැනීමේ දී, පහත දැක්වෙන "වර්ගීකරණ" හතර සැලකිල්ලට ගනු ලැබීය.

(i) ආදායම හා දරිද්‍රතාවය
(ii) සෞඛ්‍යය
(iii) අධ්‍යාපනය
(iv) යටිතල පහසුකම්

ආදායම හා දරිද්‍රතාවය පිළිබඳ වර්ගීකරණය තුළට විචල්‍යයන් තුනක් අයත් වේ. ඒවා නම්,

- මධ්‍යන්‍ය ඒක පුද්ගල ආදායම
- දරිද්‍රතා අනුපාතය
- සේවා වියුක්ති අනුපාතය

සෞඛ්‍යය පිළිබඳ වර්ගීකරණය, තෝරාගත් විචල්‍යයන් දෙකකින් යුක්ත වේ. එනම්,

- අලුත උපන් දරුවන්ගේ මරණ අනුපාතය
- අඩු බර උපත්

අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ වර්ගීකරණය තුළ සැලකිල්ලට ගනු ලබන විචල්‍යයන් වනුයේ,

- පළමු වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේ අනුපාතය
- 4, 5 හා 9 ශ්‍රේණි, අ.පො.ස. (සා/පෙළ) හා අ.පො.ස. (උ/පෙළ) ඉගෙනුම් කාර්ය සාධනය

යටිතල පහසුකම් පිළිබඳ වූ වර්ගීකරණය යටතේ, විචල්‍යයන් තුනක් හඳුනාගත් අතර, ඒවා නම්,

- විදුලිබල පහසුකම් නොමැති නිවාස සංඛ්‍යාව
- සී හා ඩී වර්ගයේ මාර්ගවල දුර ප්‍රමාණය

මෙම වර්ගීකරණයන් හතරට එක් එක් පළාතේ ජනගහන පංගුවෙන් බර තැබීම් සිදු කරන ලද අතර, අධ්‍යයනයේ දී යොදා ගත් සම්පත් බෙදා වෙන් කිරීමේ ක්‍රමවේදය (සූත්‍රය) පහත පරිදි වේ.

$$x_i = a_1 V_{1i}\bar{B} + a_2 V_{2i}\bar{B} + \ldots + a_n V_{ni}\bar{B}, \quad \sum_{i=1}^{n} a_i = 1$$

මෙහිදී,

x; = i පළාත සඳහා සිදු කළ වෙන් කිරීම්

vn.i = i පළාතේ n විචල්‍ය වර්ගීකරණයට අයත් ලකුණුවල වටිනාකම

a_n = V_n විචල්‍ය වර්ගීකරණය සඳහා තබන ලද බර

රජයේ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රමුඛතා හා බැඳුණු සාධක සැලකිල්ලට ගනිමින් එක් එක් වර්ගීකරණ සඳහා වූ බර තැබීම් මුදල් කොමිෂන් සභාව විසින් නිර්ණය කරන ලදී. මෙහිදී, පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සම්බන්ධව එක් එක් වර්ගීකරණ සඳහා තබන ලද බර පහත දැක්වේ.

- ආදායම හා දරිද්‍රතාවය 40%
- සෞඛ්‍යය 15%
- අධ්‍යාපනය 15%
- යටිතල පහසුකම් 30%

උපමාන පාදක ප්‍රදාන විෂයෙහි තබන ලද බර තැබීම් පහත පරිදි වේ.

- ජනගහනය 35%
- ඒක පුද්ගල ආදායම 20%
- දරිද්‍රතා අනුපාතය 20%
- සේවා වියුක්ති අනුපාතය 25%

2013 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන බෙදා වෙන් කිරීම්වලදී භාවිතයට ගනු ලැබූ "සංයෝජිත දර්ශක ලකුණු" (Composite Indices Scores) වගුව 12 තුළ දක්වා ඇත.

වගුව **12:** අරමුදල් වෙන් කිරීම සඳහා භාවිතයට ගනු ලැබූ සංයෝජිත දර්ශක

පළාත	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සඳහා සංයෝජිත දර්ශක ලකුණු	උපමාන පාදක ප්‍රදාන සඳහා සංයෝජිත දර්ශක ලකුණු
බස්නාහිර	0.141776	0.215716
දකුණ	0.119078	0.120791
සබරගමුව	0.119396	0.105867
මධ්‍යම	0.125506	0.125938
ඌව	0.105193	0.083533
නැගෙනහිර	0.105971	0.091885
වයඹ	0.105490	0.110560
උතුරු මැද	0.085104	0.072859
උතුර	0.092487	0.072850

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව 2011

ඉහත දැක්වෙන ක්‍රමවේදය (සූත්‍රය) පදනම් කොටගෙන, මහා භාණ්ඩාගාරය විසින් තීරණය කරන ලද අරමුදල් ප්‍රමාණය පළාත් අතර බෙදා වෙන් කිරීම සිදු කරන ලදී. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන හා උපමාන පාදක ප්‍රදාන යන අරමුදල් දෙවර්ගයම පළාත් අතර බෙදා වෙන් කිරීමේ දී ඉහත වගුවේ දැක්වූ "සංයෝජිත දර්ශක" මූලික වශයෙන් සැලකිල්ලට ගන්නා ලද අතර, වෙනත් ප්‍රායෝගික කරුණු කෙරෙහි ද කොමිෂන් සභාවේ අවධානය යොමු විය. ඒ අනුව විදේශාධාර හා දේශීය අරමුදල් යොදවා ගෙන ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හරහා පළාත් වලට වෙන් වූ අරමුදල් මෙන්ම, එක් එක් පළාත මගින් උත්පාදනය කරන ලද ආදායම ද අමතර වශයෙන් සැලකිල්ලට ගත් කරුණු වේ. මේ පිළිබඳ වැඩි විස්තර 5වන පරිච්ඡේදයේ 22 වන වගුවෙන් සපයා ඇත.

3.2 අංශ අතර සම්පත් බෙදා වෙන් කිරීමේදී සැලකිල්ලට ගනු ලැබූ කරුණු

එක් එක් පළාතේ පවත්නා විශේෂිත තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් අංශ අතර අරමුදල් බෙදා වෙන් කිරීම සිදු කරන ලදී. එහිදී, අවධානයට ලක් කරන ලද සාධකයන් වූයේ සම්පත් විභවතාවයන්, විවිධ වූ භූගෝලීය හා සමාජ ආර්ථික තත්ත්වයන් හා සාපේක්ෂව වාසි සහගත කරුණු ආදියයි. විවිධ අංශයන් හා උප අංශයන් පිළිබඳ වගකීම දරන ආයතන අතර පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල් බෙදා වෙන් කරලීමේ දී මෙකී ප්‍රායෝගික ප්‍රපංචයන් පිළිබඳ කොමිෂන් සභාවේ විශේෂ අවධානය යොමු විය. මෙම ප්‍රතිපත්තිමය මූලධර්මයට අනුගත වීම සහතික කරලනු වස්, කොමිෂන් සභාව හා පළාත් අධිකාරීන් අතර සාකච්ඡා වට ගණනාවක් පැවති අතර, එක් එක් සංවර්ධන අංශ අතර අරමුදල් වෙන් කිරීම පිළිබඳව ඒවායේදී තීරණවලට එළඹින. මීට අමතර වශයෙන්, අංශ අතර සම්පත් බෙදා වෙන් කිරීමේ ක්‍රියාවලිය තුළදී පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ද සැලකිලිමත් වූ බව කිව යුතුය.

(i) ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුවෙහි දැක්වෙන ප්‍රතිපත්ති හා ඉලක්ක සමඟ අනුගත වීම සහතික කරලනු වස්, ප්‍රධාන ජාතික මට්ටමේ අමාත්‍යාංශ හා ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ සාකච්ඡා කොට ආංශික ප්‍රතිපත්ති හා ඉලක්ක පිළිබඳ අදහස් හා යෝජනා ලබා ගැනීම. ජාතික හා පළාත් මට්ටමෙන් සිදුවිය හැකි ද්විකරණය වළක්වාලීම ද මෙහි අරමුණක් විය.

(ii) එක් එක් පළාතට පැතිරුණු ප්‍රතිවිපාක (Ripple effects) අත්කර දෙන, වෙනත් අරමුදල් මූලාශ්‍ර හරහා ක්‍රියාත්මක වන විශේෂ ව්‍යාපෘති මඟින් වෙන් කරන ලද සම්පත්.

(iii) විවිධ ආදායම් කාණ්ඩ අතර දක්නට ලැබෙන විෂමතාවයන් අවම කිරීම අරමුණු කොට ගෙන සෑම පළාතක් තුළම "ජනතාවගේ අවම ශුභ සාධන මට්ටම" තහවුරු කරලීම.

(iv) සංවර්ධන ව්‍යාපෘති විෂයෙහි පෞද්ගලික අංශයේ දායකත්වය ඉහළ නැංවීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රවේශය (PPP approach) දිරි ගැන්වීම.

(v) පළාත් මට්ටමින් පවත්වන ලද ප්‍රතිඵල පාදක කළමනාකරණය පිළිබඳ වැඩමුළුවල දී පළාත් සංවර්ධන අවශ්‍යතාවයන් හා අරමුදල් සම්බන්ධයෙන් පළාත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් දක්වන ලද අදහස් හා යෝජනා.

(vi) ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ දී පවත්වන ලද පළාත් මධ්‍යකාලීන සැලසුම් එළිදැක්වීමේ වැඩමුළුවේ දී ඉදිරිපත් වූ නිරීක්ෂණ හා නිර්දේශ.

(vii) ජනාධිපති ලේකම් කාර්යාලයේ මූලිකත්වයෙන් ආරම්භ කරන ලද වැසී යාමේ තර්ජනයට මුහුණ දී සිටින කුඩා පාසල් නගා සිටුවීමේ වැඩසටහන යටතේ අරමුදල් වෙන් කිරීම පිළිබඳව දෙන ලද විශේෂ උපදෙස්.

කාර්යක්ෂම සම්පත් කළමනාකරණ ප්‍රවේශයක් හරහා පළාත්වල ප්‍රමුඛතාවන් හා තිරසාර සංවර්ධනයක් තහවුරු කරලීමේ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කිරීමේ පදනම මත පිහිටා, සම්පත් වෙන් කිරීමේ දී සමානාත්මතා මූලධර්මය අඛණ්ඩව අනුගමනය කිරීම මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරනු ඇත. කෙසේ වුවද, සමහර පර්යේෂකයින් විසින් ඉදිරිපත් කොට ඇති කරුණුවලට අනුව දැනට පවත්නා ක්‍රමය යටතේ පළාත්වල වැඩි අරමුදල් ප්‍රමාණයක් එදිනෙදා ක්‍රියාකාරී වියදම් හෙවත් පුනරාවර්තන වියදම් ලෙස වැය වන අතර, ආර්ථික හා සමාජයීය වත්කම් නිර්මාණය වෙනුවෙන් ආයෝජනය කෙරෙනුයේ සීමිත ප්‍රතිශතයකි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පළාත් මට්ටමෙන් ප්‍රජාවට සේවා සැපයීමේ ගුණාත්මකභාවය, ව්‍යවසායකත්වයන් දිරි ගැන්වීමේ ධාරිතාවය, අළුතින් රැකියා ජනිත කිරීමේ අවකාශය හා ජනතාවගේ ආදායම් උත්පාදනය වැඩිදියුණු කිරීමට ඇති ඉඩකඩ වැනි කරුණුවලට සීමාවන් හා සංරෝධකයන් නිර්මාණයවී තිබේ. දැනට මුදල් කොමිෂන් සභාව මේ සම්බන්ධයේ අධ්‍යයනයක් ආරම්භ කොට ඇති අතර, සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ අත්කර ගැනීමෙහි ලා අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් ඉතා හොඳ ප්‍රතිඵල ලබා ගැනීම පිණිස මෙම පුනරාවර්තන වියදම් විශාල දායකත්වයක් සපයන බවට විශ්වාසය පළ කරනු ලබයි. සැබෙවින්ම මෙම පුනරාවර්තන වියදම්වලින් වැඩි ප්‍රතිශතයක් වැය කෙරෙනුයේ සෞඛ්‍ය හා අධ්‍යාපන යන අංශවලට අයත් සේවා සැපයීම වෙනුවෙනි. එමෙන්ම, ජාතික මට්ටමේ අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්වලට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනයෙහිලා පළාත් විසින් වෙනත් අංශ වලට අදාලව සිදු කරනු ලබන පුනරාවර්තන වියදම් පියවා ගැනීම ද මේ තුළින් සිදු කෙරේ. මේ අනුව පෙනී යන්නේ පළාත් පුනරාවර්තන වියදම්වලින් පළාත් මට්ටමෙන් පමණක් නොව, ජාතික මට්ටමෙන් පවා ආරම්භ කෙරෙන ආයෝජන සඳහා මහත් රුකුලක් සැපයෙන බවයි.

4. පළාත් ආදායම

පළාත් ආදායම ප්‍රධාන මූලාශ්‍ර දෙකකින් යුක්ත වේ.

(i) රජයේ ආදායම් මාරු කිරීම
(ii) බලය බෙදා හරින ලද මූලාශ්‍රවලින් එකතු කළ ආදායම

4.1 රජයේ ආදායම් මාරු කිරීම

රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයක් අනුව ව්‍යාපාර පිරිවැටුම් බද්ද අහෝසි කරන ලද අතර, 2011 වර්ෂයේ සිට බලපවත්වන පරිදි, ජාතික වශයෙන් එකතු කරන ලද ආදායම බෙදා ගැනීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. මේ අනුව 2010 අංක 01 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය මඟින් උපදෙස් දී ඇති පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, රේගු අධ්‍යක්ෂ ජනරාල් හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් යන ජාතික අධිකාරීන් විසින් එකතු කරන ලද ආදායම පළාත්වලට මාරු කරනු ලැබේ. එහිදී පහත දැක්වෙන පදනමින් අදාල මාරු කිරීම් සිදු කරනු ඇත.

(i) ජාතිය ගොඩනැගීමේ බද්දෙන් - 33 1/3%
(ii) මුද්දර බදුවලින් - 100%
(iii) රථවාහන ලියාපදිංචි ගාස්තුවෙන් - 70%

එකතු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද සහ මුද්දර බදු, විශේෂිත බැංකු ගිණුමක් හරහා දෙසතියකට වරක් පළාත් අතර මාරු කර හැරීම සිදු කෙරේ. මෙම ක්‍රියාවලියේ දී පහත දැක්වෙන ප්‍රතිශත අනුගමනය කරනු ලබන අතර, මහා භාණ්ඩාගාරය විසින් මුදල් කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව එකී අනුපාත කලින් කලට වෙනස් කරනු ඇත.

පළාත	අනුපාතය
බස්නාහිර	48%
මධ්‍යම	9%
දකුණ	9%
වයඹ	9%
සබරගමුව	5%
උතුරු මැද	5%
ඌව	5%
නැගෙනහිර	5%
උතුර	5%

2011 සහ 2012 (සැප්තැම්බර් දක්වා) යන වර්ෂවලදී පළාත් වලට මාරු කරන ලද රජයේ ආදායම් පිළිබඳ විස්තර වගුව 13 හි දක්වා ඇත.

වගුව 13: රජයේ ආදායම් මාරු කිරීම - 2011 සහ 2012

රු.මි.

පළාත	2011		2012	
	ඉලක්ක	මාරු කිරීම්	ඉලක්ක	සැප්තැම්බර් දක්වා මාරු කිරීම් **
බස්නාහිර	15,360	12073*	15,360	10,157
මධ්‍යම	2,880	2,210	2,880	1,919
දකුණ	2,880	1,677	2,880	1,747
උතුර	1,600	1,187	1,600	958
වයඹ	2,880	2,101	2,880	2,142
උතුරු මැද	1,600	1,179	1,600	1,039
ඌව	1,600	1,115	1,600	1,073
සබරගමුව	1,600	1,180	1,600	922
නැගෙනහිර	1,600	1,021	1,600	990
එකතුව	**32,000**	**23,743**	**32,000**	**20,947**

මූලාශ්‍රය: පළාත් සභාවල මාසික ආදායම් වාර්තා - 2011 සහ 2012
**රු.මි.1,000*ක පරිපූරක ඇස්තමේන්තු ඇතුළත්ව*
***තාවකාලික*

වගුව 13 හි දැක්වෙන සංඛ්‍යා ලේඛනවලට අනුව පළාත් විසින් ඉලක්ක කරන ලද ආදායවලට වඩා අඩු ප්‍රමාණයක් ලැබුණු බව පෙනී ගියද, බස්නාහිර පළාත හැර අනෙකුත් පළාත්වල ආදායම 2011 වර්ෂයට පෙර පළාත් ආදායම් හා සසඳන විට ඉහළ මට්ටමක පවත්නා බව නිරීක්ෂණය කළ හැකිය.

4.2 බලය බෙදාහරින ලද මූලාශ්‍රවලින් එකතු කරන ලද ආදායම

දහතුන්වන ආණ්ඩුක්‍රම සංශෝධනයේ නව වන උපලේඛනයෙහි 36.01 සිට 36.20 දක්වා කොටසෙහි ලැයිස්තු ගත කොට ඇති පරිදි, බදු හා බදු නොවන ආදායම් මූලාශ්‍ර මගින් පළාත් ආදායම් එකතු කරනු ලැබේ. මෝටර් රථ ලියාපදිංචි කිරීමේ ගාස්තු, සුරාබදු, මුද්දර බදු හා උසාවි දඩ මෙම පළාත් ආදායම් මූලාශ්‍ර අතර ප්‍රධාන වේ.

2011 සහ 2012 යන වර්ෂවල බලය බෙදා හරින ලද මූලාශ්‍ර වලින් එකතු කරන ලද ආදායම පිළිවෙලින් වගුව 14 හා වගුව 15 තුළ විස්තරාත්මකව දක්වා ඇත.

වගුව 14: මූලාශ්‍ර අනුව එකතු කරන ලද පළාත් ආදායම - 2011

(රු.'000)

පළාත	ව්‍යාපාර පිරිවැටුම් බදු*	වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු	සුරා බදු	මුද්දර ගාස්තු	උසාවි දඩ	වෙනත්**	එකතුව
බස්නාහිර	2,186,050	2,573,020	263,620	6,354,370	571,370	1,936,320	13,884,750
මධ්‍යම	417,388	492,551	184,817	607,923	67,754	211,875	1,982,308
දකුණ	381,374	428,622	63,420	828,365	166,487	291,542	2,159,810
උතුර***	-	-	-	-	-	80,983	80,983
වයඹ	193,607	551,466	69,136	899,307	309,164	247,035	2,269,715
උතුරු මැද	116,525	284,387	24,110	50,150	193,097	239,840	908,109
ඌව	115,311	143,481	53,750	125,550	96,156	129,357	663,605
සබරගමුව	129,659	351,105	44,037	304,804	112,351	178,506	1,120,462
නැගෙනහිර	112,216	215,508	28,684	133,313	74,127	128,011	691,859
එකතුව	**3,652,130**	**5,040,140**	**731,574**	**9,303,782**	**1,590,506**	**3,443,469**	**23,761,601**

මූලාශ්‍රය: පළාත් සභාවල මාසික ආදායම් වාර්තා - 2011
**2010 දක්වා හිඟ ව්‍යාපාර පිරිවැටුම් බදු එකතු කිරීම*
***වෙනත් යටතේ කුළී, පොළී, විභාග ගාස්තු, ප්‍රාග්ධන වත්කම් විකිණීම්, ඔට්ටු බදු ආදිය ඇතුළත්ය*
****පළාත් ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදයක් නොමැත*

වගුව 15: මූලාශ්‍ර අනුව එකතු කරන ලද ආදායම - 2012* (සැප්තැම්බර් දක්වා)

රු.මි.

පළාත	ව්‍යාපාර පිරිවැටුම් බදු**	වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු	සුරා බදු	මුද්දර ගාස්තු	උසාවි දඩ	වෙනත්***	එකතුව
බස්නාහිර	65.27	2,407.19	108.79	5,184.66	486.58	1,208.79	9,461.28
මධ්‍යම	39.70	464.89	107.57	645.96	49.36	140.28	1,447.76
දකුණ	25.74	386.82	20.62	1,169.75	185.90	173.43	1,962.25
උතුර****	-	-	-	-	-	59.22	59.22
වයඹ	52.00	647.69	42.97	671.91	243.69	8.26	1,666.52
උතුරු මැද	9.40	295.64	21.03	36.73	139.33	93.85	595.99
ඌව	2.18	152.86	27.04	98.88	57.51	127.96	466.42
සබරගමුව	-	211.64	25.20	87.00	92.41	155.01	571.27
නැගෙනහිර	-	99.75	18.31	0.02	51.55	106.74	276.38
එකතුව	**194.30**	**4,666.48**	**371.53**	**7,894.91**	**1,306.33**	**2,073.54**	**16,507.08**

මූලාශ්‍රය: පළාත් සභාවල මාසික ආදායම් වාර්තා - 2011

**තාවකාලික*
***2010 දක්වා හිඟ ව්‍යාපාර පිරිවැටුම් බදු එකතු කිරීම*
****වෙනත් යටතේ කුළී, පොළී, විභාග ගාස්තු, ප්‍රාග්ධන වත්කම් විකිණීම්, ඔට්ටු බදු ආදිය ඇතුළත්ය*
*****පළාත් ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදයක් නොමැත*

බස්නාහිර පළාත ඉහළම ආදායම් එකතු කරන්නා ලෙස අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර, 2011 වර්ෂයේ දී එම පළාත විසින් සමස්ත පළාත් ආදායමට සිදු කරන ලද දායකත්වය 58% කි. පසුගිය වර්ෂ හා සසඳන විට, බස්නාහිර පළාතෙන් සමස්ත පළාත් ආදායමට කරන ලද දායකවීම පහළ බැසීමේ ප්‍රවණතාවක් පෙන්වයි. මෙය 2008,2009 හා 2010 යන වර්ෂවල පිළිවෙලින් 66%, 61% හා 62% වශයෙන් දැක්විය හැකිය.

ජාතික මට්ටමෙන් එකතු කරන ලද ආදායම පළාත් අතර බෙදා හැරීමේ යාන්ත්‍රණය තුළින් අඩු දියුණු පළාත්වල ආදායම වැඩි දියුණු කර ගැනීම සඳහා පිටිවහලක් සැපයෙන අතර, සමස්ත පළාත් ආදායමට සිදු කරනු ලබන දායකත්වය වැඩිකර ගැනීමට ද හැකි වී තිබේ.

දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් විසින් සම්මත කර ගනු ලැබූ ප්‍රඥප්තීන් තුළින් පළාත් විසින් මුද්දර බදු හා උසාවි දඩ වශයෙන් එකතු කරන ලද ආදායම ආදාල පළාත් පාලන ආයතන වෙත වාර්ෂිකව මාරු කිරීම සිදු කළ යුතු වේ. මුද්දර බදු මගින් එකතු කරන ලද ආදායම, උසාවි දඩවලින් ලද ආදායමට වඩා වැඩි බව නිරීක්ෂණයට කළ හැකිය. කරුණාකර වගුව 14 හා වගුව 15 බලන්න.

4.3 පළාත් ආදායම් ඉලක්ක සැකසීම

පළාත් සඳහා ආදායම් ඉලක්ක සැකසීමේ ක්‍රමවේදය, ප්‍රධාන පළාත් ආදායම් මූලාශ්‍ර දෙකක් මත පදනම් වේ.

1. 2010.12.29 දිනැති අංක 01/2010 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව, සියළුම පළාත්වලට මාරු කළ යුතු වාර්ෂික මුදල් ප්‍රමාණයන් මහා භාණ්ඩාගාරය විසින් තීරණය කරනු ඇත. 2013 වර්ෂය සඳහා පළාත්වලට මාරු කළ යුතු රාජ්‍ය ආදායම, මුදල් කොමිෂන් සභාවේ හා මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ඇතිව පහත දැක්වෙන ප්‍රතිශතයන් පදනම් කොට ගෙන පුරෝකථනය කර තිබේ.

පළාත	අනුපාතය
බස්නාහිර	48%
මධ්‍යම /දකුණ/ වයඹ	9%
සබරගමුව /උතුරු මැද/ ඌව/ නැගෙනහිර/ උතුර	5%

2. මුදල් කොමිෂන් සභාව විසින් සකසන ලද බලය පැවරූ ආදායම් මූලාශ්‍ර සඳහා වූ ඉලක්ක, පළාත් අධිකාරීන් විසින් ඉදිරිපත් කරන ලද ආදායම් තක්සේරු හා පළාත් ආදායම් එකතු කිරීමේ අතීත කාර්ය සාධනය මත පදනම් වේ.

ඉහත දැක්වෙන ක්‍රමවේදය යටතේ පිළියෙල කරන ලද ඉලක්ක ගත මුළු ආදායම, සාමූහික ප්‍රදාන යටතේ පළාත් සඳහා ඇස්තමේන්තු කරන ලද පුනරාවර්තන වියදමෙන් අඩු කෙරේ. පළාත් සඳහා ආදායම් ඉලක්ක සැකසීමේ දී මුදල් කොමිෂන් සභාව විසින් මහා භාණ්ඩාගාරය හා අදාළ පළාත් අධිකාරීන් සමඟ උපදේශනාත්මක ක්‍රියාවලියක නිරත වනු ඇත.

4.4 2013 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන

2013 වර්ෂය සඳහා ආදායම් පුරෝකථනය කිරීමේ පදනම ලෙස මෙයට ප්‍රථම වර්ෂවල හා 2012 වර්ෂයේ මුල් හය මාසය තුළ එකතු කරන ලද සත්‍ය ආදායමට අදාල කාර්ය සාධනය, මුදල් කොමිෂන් සභාව විසින් විශ්ලේෂණය කරන ලදී. 2013 වසරේ දී සියළුම පළාත් සඳහා මුද්දර බදු හා උසාවි දඩ ඇතුළත්ව මුදල් කොමිෂන් සභාව විසින් පුරෝකථනය කරන ලද බලය පැවරූ ආදායම් මූලාශ්‍ර වල එකතුව රු.මිලියන 19,412 කි. 2013 වර්ෂය සඳහා මුද්දර බදු හා උසාවි දඩ නොමැතිව මුදල් කොමිෂන් සභාව විසින් පුරෝකථනය කරන ලද ආදායම රු.මිලියන 9,775 කි. බලය පැවරූ ආදායම් මූලාශ්‍ර යටතේ 2013 වර්ෂය සඳහා පළාත් සභා විසින් ඇස්තමේන්තු කරන ලද ආදායම සහ මුදල් කොමිෂන් සභාව විසින් පුරෝකථනය කරන කරනු ලැබූ ආදායම වගුව 16 මගින් පෙන්වා දෙනු ලබයි.

වගුව 16: 2013 වර්ෂය සඳහා ආදායම් පුරෝකථන

(රු.'000)

පළාත	මුද්දර ගාස්තු හා උසාවි දඩ ඇතුළත්ව ආදායම් පුරෝකථනය			මුද්දර ගාස්තු හා උසාවි දඩ හැර ආදායම් පුරෝකථනය		
	පළාත් ඇස්තමේන්තුව	මුදල් කොමිෂන් සභාවේ පුරෝකථනය	දල් කොමිෂන් සභාවේ පුරෝකථනය % ලෙස	පළාත් ඇස්තමේන්තුව	මුදල් කොමිෂන් සභාවේ පුරෝකථනය	මුදල් කොමිෂන් සභාවේ පුරෝකථනය % ලෙස
බස්නාහිර	7,602,520	10,450,000	54	3,062,520	4,850,000	50
මධ්‍යම	1,766,999	1,841,000	9	836,999	911,000	9
දකුණ	1,853,369	1,858,500	10	1,043,369	1,043,500	11
උතුර	188,000	188,000	1	188,000	188,000	2
වයඹ	2,173,000	2,173,000	11	1,023,000	1,023,000	10
උතුරු මැද	699,892	701,000	4	467,892	469,000	5
ඌව	568,573	589,410	3	413,573	414,410	4
සබරගමුව	939,915	940,000	5	539,915	540,000	6
නැගෙනහිර	671,200	671,200	3	336,200	336,200	3
එකතුව	**16,463,468**	**19,412,110**	**100**	**7,911,468**	**9,775,110**	**100**

මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු 2013 සහ මුදල් කොමිෂන් සභාව

බලය පැවරූ ආදායම් මූලාශ්‍ර යටතේ මුද්දර බදු හා උසාවි දඩ උපයෝගී කර ගනිමින් 2013 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු ආදායම් ප්‍රමාණය රු.මිලියන 9,637 කි. මේ පිළිබඳ වැඩි විස්තර වගුව 17 තුළ විස්තර කර ඇත.

වගුව 17: 2013 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු මුද්දර බදු හා උසාවි දඩ

(රු.'000)

පළාත	මුද්දර බදු	උසාවි දඩ	එකතුව	%
බස්නාහිර	5,000,000	600,000	5,600,000	58
මධ්‍යම	860,000	70,000	930,000	10
දකුණ	640,000	175,000	815,000	8
උතුර	-	-	-	-
වයඹ	825,000	325,000	1,150,000	12
උතුරු මැද	52,000	180,000	232,000	2
ඌව	100,000	75,000	175,000	2
සබරගමුව	300,000	100,000	400,000	4
නැගෙනහිර	260,000	75,000	335,000	3
එකතුව	**8,037,000**	**1,600,000**	**9,637,000**	**100**

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව

අංක 01/2010 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව 2013 වර්ෂය සඳහා ජාතික මට්ටමෙන් එකතු කරන ලද රු.මිලියන 38,000 ක මුදල පළාත්වලට මාරු කරනු ඇත. මේ පිළිබඳ විස්තර වගුව 18 මගින් පෙන්නුම් කෙරේ.

වගුව **18:** රාජ්‍ය ආදායම පළාත්වලට මාරු කිරීම - **2013**

(රු.'000)

පළාත	මාරු කිරීම්	%
බස්නාහිර	18,240,000	48
මධ්‍යම	3,420,000	9
දකුණ	3,420,000	9
උතුර	1,900,000	5
වයඹ	3,420,000	9
උතුරු මැද	1,900,000	5
ඌව	1,900,000	5
සබරගමුව	1,900,000	5
නැගෙනහිර	1,900,000	5
එකතුව	**38,000,000**	**100**

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව

4.5 පළාත් ආදායම ඵලදායී ලෙස උපයෝජනය කිරීම

පළාත් විෂයෙහි පවත්නා විභවතාවයන් පිළිබඳ විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ, බලය පැවරූ ආදායම් මූලාශ්‍ර හරහා උපයාගත හැකි ආදායම් වැඩිකර ගැනීමේ මහත් වූ අවස්ථාවන් පවතින බව හා පළාත් පාලන ආයතන සතුව ද එවැනි ආදායම් උත්පාදක අවස්ථා බහුල වශයෙන් ඇති බවයි.

4.5.1. බලය පවරන ලද ආදායම් මූලාශ්‍රවලින් ආදායම එකතු කිරීම

ආදායම් එකතු කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කරගනු ලබන්නේ නම්, ස්වකීය ආදායම් අවස්ථා පුළුල් කර ගැනීමේ මහත් ඉඩකඩ පළාත් සතුව පවත්නා බව පැහැදිලියි. මේ අනුව බලන විට වැදගත් කරුණක් වනුයේ, නව ආදායම් පදනම වැඩිදියුණු කර ගනු වස් පළාත් අධිකාරීන් විසින් ස්වකීය සම්පත් උපයෝජනයට ගැනීම තවදුරටත් ගවේෂණාත්මකව සොයා බැලිය යුතු බවයි.

නවවන උපලේඛනයෙහි 36.20 උප පරිච්ඡේදයෙහි දක්වා ඇති ''අනෙකුත් ආදායම් මූලාශ්‍ර'' හරහා ආදායම් එක්රැස් කිරීම පිළිබඳ වූ නව්‍ය ප්‍රවේශයන් කෙරෙහි පළාත් අධිකාරීන් දැඩි සේ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වන බව කිව යුතුය. එම උප ලේඛනයෙහි උප පරිච්ඡේදය මගින් කියැවෙන අදහස පහත දැක්වේ.

''පාර්ලිමේන්තුව මගින් පනවන ලද නීතිරීති මගින් ඉඩ ප්‍රස්ථා සලසා දෙන ප්‍රමාණයට, පළාත් අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය කරනු ලබන ආදායම් ඉහළ නංවා ලනු පිණිස පළාත් තුළ පවත්නා අනෙකුත් බදු අය කිරීම් සිදු කිරීම.''

මෙම සන්දර්භය තුළ පළාත් අධිකාරීන් විසින් ආදායම් උත්පාදනයට අදාල නව ක්‍රමවේදයක් පිළිබඳව සුදුසු උපදෙස් ලබා ගෙන ඒ අනුව ක්‍රියාකළ යුතු බවට නිර්දේශ කෙරේ.

4.5.2. ආදායම් එකතු කිරීම සඳහා මානව සම්පත් කාර්යක්ෂම අයුරින් උපයෝජනය කිරීම

සියළුම පළාත්වලට අයත් ආදායම් දෙපාර්තමේන්තුවලට අනුයුක්තව 500 කට වඩා අධික කාර්යමණ්ඩලයක් සිටිති. 2011 වර්ෂයේදී ව්‍යාපාරික පිරිවැටුම් බද්ද අහෝසි කිරීමත් සමඟ මෙම නිලධාරීන්ගේ සේවය ප්‍රශස්ත අයුරින් යොදා නොගන්නා බව පෙනේ. විශේෂයෙන් පිරිවැටුම් බද්ද හැර අනෙකුත් බලය පවරන ලද ආදායම් මූලාශ්‍රවලින් ආදායම් උත්පාදනය කිරීමේ කාර්යයට මෙම පිරිස යොදා නොගැනීම කැපී පෙනෙන ලක්ෂණයකි. මෙයට අමතරව පළාත් පාලන ආයතන මට්ටමෙන් ද ආදායම් ජනනය කළ හැකි බොහෝ අවස්ථා පවතී. නිදසුනක් ලෙස වසර කිහිපයක් තිස්සේම වරිපනම් එකතු කිරීම ක්‍රමවත් අයුරින් සිදු නොවන අතර, ඒවා යාවත්කාලීන කිරීම ද සිදු වී නොමැත. දැනට පළාත්වලට අයත් කාර්යක්ෂමව සේවයේ නොයොදවා සිටින ඉහත සඳහන් කරන ලද නිලධාරීන් මෙවැනි ආදායම් උත්පාදන කාර්යයනට යොදවන්නේ නම්, පළාත් පාලන ආයතනවල ආදායම් තත්වය වඩාත් වැඩි දියුණු කරලීමේ අවකාශ පවතී. මෙම තත්වයන් සැලකිල්ලට ගෙන ආදායම් උත්පාදනය වැඩි දියුණු කරලීම පිණිස පළාත් අධිකාරීන් විසින් වඩාත් යෝග්‍ය හා විකල්පමය ක්‍රමවේදයන් භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ. තවද, පළාත් ආදායම් නිලධාරීන් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් උපයෝජනයට ගැනීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීමෙහි ලා මහ ඇමතිවරුන් හා ප්‍රධාන ලේකම්වරුන් මූලිකත්වය ගත යුතු බව මෙහි ලා අවධාරණය කළ යුතුය.

4.5.3. ආදායම් ඵලදායී ලෙස භාවිතයට ගැනීම

එකතු කරන ලද ආදායමෙන් එක්තරා කොටසක් සංවර්ධන අරමුණු සඳහා සෘජුවම දායක නොවන කාර්යයන් සඳහා යොදවන බව නිරීක්ෂණය කර ඇත. සමහර පර්යේෂණ අධ්‍යයන මගින් පෙන්වා දී ඇති පරිදි බොහෝ යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් නාගරික ප්‍රදේශවලට පමණක් සීමා වන අතර, ග්‍රාමීය මාර්ග, බෝක්කු, අඩිපාරවල් හා පියගැටපෙලවල් වැනි ග්‍රාමීය මූලික පහසුකම් සඳහා යොමුවන අවධානය ප්‍රමාණවත් නොවේ. මෙම තත්වය තුළ, පුනරාවර්තන අරමුණු සඳහා වැය කිරීමෙන් අනතුරුව ඉතිරි වන ආදායම් පොදු ජනතාවට ප්‍රතිලාභ අත්කර දෙන ඵලදායී අරමුණු සඳහා වැය කිරීම අත්‍යවශ්‍ය කරුණක් වනු ඇත.

පළාත් සභා විසින් මුද්දර බදු හා උසාවි දඩ පළාත් පාලන ආයතන වෙත මාරු කිරීම අපේක්ෂා කළ ද, එසේ නොකර එම ආදායම් පළාත් සභා තුළම රඳවා ගැනීමේ ප්‍රවණතාවයක් පවතින බව පෙනී යයි. මෙයට ප්‍රධාන හේතුව වනුයේ අදාල පළාත් පාලන ආයතන වෙත මාරු කළ යුතු උසාවි දඩ ගණනය කිරීම පිළිබඳව ඇති සංකීර්ණතාවයයි. මෙම ගැටළුකාරී තත්වය මගහැරලීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව මුදල් කොමිෂන් සභාව, අධිකරණ අමාත්‍යාංශය සමඟ සංවාදයක නියැලුන අතර, උසාවි දඩ ලෙස එකතු කරන ලද ආදායම් පළාත් පාලන ආයතන අතර බෙදා දීම සඳහා වූ ක්‍රමවේදයක් (Formula) සකස් කර ඇත. ජනාධිපති ලේකම්තුමාගේ ඉල්ලීම පරිදි මුදල් කොමිෂන් සභාව විසින් මෙම ක්‍රමවේදය අවශ්‍ය කටයුතු සඳහා යොමු කොට තිබේ. මුදල් කොමිෂන් සභාවේ අදාල නිර්දේශ උසාවි ක්‍රමය හරහා ක්‍රියාත්මක කරන ලෙස ජනාධිපති ලේකම්තුමා විසින් අධිකරණ අමාත්‍යාංශයට උපදෙස් දී ඇත.

5. පළාත් අරමුදල් තක්සේරු කිරීම හා බෙදා වෙන් කිරීම

අයවැය මාර්ගෝපදේශවල සඳහන් නිර්ණායක භාවිතා කරමින් පළාත්වලින් ලබා ගත් පළාත් මූල්‍ය අවශ්‍යතා විශ්ලේෂණය කිරීමේ දී, මුදල් කොමිෂන් සභාව ඉතා වෙහෙසකර ක්‍රියාවලියක නිරත වේ. මෙම ක්‍රියාවලිය තුළදී අදාල පළාත් නිලධාරීන් සමඟ සාකච්ඡාවල නිරත වන අතර, පළාත් සංවර්ධන ප්‍රමුඛතාවලට අදාල පුළුල් පරාසයක වූ දත්ත හා තොරතුරු, අවශ්‍ය කරනු ලබන සේවා සැපයුම හා සත්‍ය කාර්ය මණ්ඩලය වැනි කරුණු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ඇත. අනතුරුව කොමිෂන් සභාව විසින් පළාත් මූල්‍ය අවශ්‍යතා පිළිබඳ සිදු කරන ලද තක්සේරුව මහා භාණ්ඩාගාරයට භාර දෙනු ලබයි. කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කිරීමෙන් පසු පළාත් අතර බෙදා වෙන් කරනු ලබන මුළු අරමුදල් ප්‍රමාණය පිළිබඳව මහා භාණ්ඩාගාරය විසින් එකඟතාවයකට එළඹෙනු ඇත. මෙලෙස මුළු අරමුදල් ප්‍රමාණය පිළිබඳව එකඟත්වයකට එළඹීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විසින් සකස් කරන ලද නිර්ණායක කුලකයක් පදනම් කර ගනිමින් එකී අරමුදල් පළාත් අතර බෙදා වෙන් කෙරේ. ව්‍යවස්ථාමය ප්‍රතිපාදනවලට අනුව ජාතික අයවැයෙන් ලැබෙන අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීම හා සම්බන්ධ මූලධර්මවලට අයත් නිර්දේශ කොමිෂන් සභාව විසින් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

5.1 රජයේ අරමුදල් වලට අයත් ප්‍රධාන මූලාශ්‍ර

ජාතික අයවැයෙන් ලැබෙන අරමුදල් පළාත් වෙත බෙදා වෙන් කිරීමේදී, මූලික වශයෙන් ප්‍රදාන (Grants) වර්ග තුනක් භාවිතයට ගැනේ. ඒවා නම්,

(i) **සාමූහික ප්‍රදාන**

සේවා සැපයුම් පද්ධතිය පවත්වා ගැනීමේ හා වැඩිදියුණු කිරීමේ අරමුණින් පළාත් අවශ්‍යතා සපුරා ගැනීම පිණිස අවශ්‍ය කරනු ලබන පුනරාවර්තන වියදම්, සාමූහික ප්‍රදාන මගින් සැපයේ. කාර්යමණ්ඩලවලට ගෙවනු ලබන වැටුප්, වේතන හා අනෙකුත් දීමනා සහ පළාත් සභා හා පළාත් පාලන ආයතනවල තේරී පත්වූ සාමාජිකයින්ගේ දීමනා මේ තුළ අන්තර්ගත වේ.

(ii) **උපමාන පාදක ප්‍රදාන**

පළාත තුළ සමාජ - ආර්ථික තත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය කරනු ලබන ප්‍රාග්ධන වියදම්, උපමාන පාදක ප්‍රදාන හරහා ලබා දෙනු ඇත. මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ඇතුළත සිටිමින් පළාත්වල සංවර්ධනය සඳහා උපකාරී වන කාර්යයන් වෙනුවෙන් පළාත් සභාවේ අභිමතය පරිදි වැය කිරීමට මෙම ප්‍රදාන සපයා දෙනු ඇත.

(iii) **පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන**

ප්‍රාග්ධන ස්වරූපයේ සංවර්ධන ව්‍යාපෘතිවල ආයෝජනය කරනු වස් මෙම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සැපයෙනු ඇත. ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම අරමුණු කොට ගත් සමාජ-ආර්ථික යටිතල පහසුකම් අවශ්‍යතා පිළිබඳව මෙහිදී විශේෂ අවධානය යොමු කෙරේ.

5.2 පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ඉල්ලුම් කිරීම

2012 වර්ෂයේ පෙබරවාරි මස 16 වන දින මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද "මූල්‍ය අවශ්‍යතා ඉල්ලුම් කිරීමේ මාර්ගෝපදේශ" අනුව පළාත් අධිකාරීන් විසින් 2013 මූල්‍ය වර්ෂය සඳහා වූ මූල්‍ය අවශ්‍යතා

පිළිබඳ ඇස්තමේන්තු ඉදිරිපත් කළ යුතු විය. වාර්ෂික ප්‍රාග්ධන අවශ්‍යතා ඉදිරිපත් කිරීමේ දී ඉහත මාර්ගෝපදේශවලට අමුණා ඇති ආකෘති පත්‍ර 2 (Form 2) භාවිතා කරන ලෙස උපදෙස් දී තිබුණි.

2013 වර්ෂය සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඉල්ලුම් කරන ලද ප්‍රාග්ධන මූල්‍ය අවශ්‍යතා, වගුව 19 මගින් පෙන්නුම් කර ඇත.

වගුව 19: පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පළාත්වලින් කරන ලද ඉල්ලීම් - 2013

(රු.මි.)

පළාත	මුළු ඇස්තමේන්තුව	%
බස්නාහිර	13,672	21
මධ්‍යම	4,212	6
දකුණ	11,874	18
උතුර	4,521	7
වයඹ	6,398	10
උතුරු මැද	4,978	8
ඌව	9,181	14
සබරගමුව	6,645	10
නැගෙනහිර	4,382	7
එකතුව	**65,863**	**100**

මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු - 2013
සටහන: ජාතික වශයෙන් එකඟ වී ඇති විදේශ හා දේශීය ව්‍යාපෘති හැර

5.3 පළාත් පුනරාවර්තන අවශ්‍යතා සඳහා ඉල්ලුම් කිරීම

පුනරාවර්තන වියදම් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ. එනම්, පුද්ගල පඩිනඩි හා අනෙකුත් පුනරාවර්තන වියදම් වශයෙනි. වැටුප් හා වේතන, අතිකාල දීමනා, නිවාඩු දින දීමනා සහ අනෙකුත් සේවක දීමනා පුද්ගල පඩිනඩි තුළට අයත් වේ. අනෙකුත් පුනරාවර්තන වියදම් ලෙස හැඳින්වෙන්නේ ප්‍රවාහන දීමනා, සැපයුම් නඩත්තු කිරීම්, ගිවිසුම් ගත සේවා, ආයතනවලට කරනු ලබන මාරු කිරීම්, ප්‍රදාන, සහනාධාර සහ පොළී ගෙවීම් යනාදියයි. මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍ර භාවිතයට ගනිමින් පළාත් විසින් ස්වකීය පළාත් පුනරාවර්තන අවශ්‍යතා ඉදිරිපත් කරනු ඇත.

2013 වර්ෂය සඳහා පළාත් සභා විසින් ඉල්ලුම් කරන ලද පුනරාවර්තන වියදම් අවශ්‍යතා, වගුව 20 මගින් පෙන්නුම් කෙරේ.

වගුව 20: පුනරාවර්තන වියදම්වලට අදාලව පළාත් විසින් කරන ලද ඉල්ලීම් - 2013 පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම්, මුද්දර බදු හා උසාවි දඩ ඇතුළත්ව

(රු.'000)

අංකය	පළාත	පුද්ගල පඩි නඩි	%	වෙනත් පුනරාවර්තන වියදම්	%	මුළු පුනරාවර්තන වියදම්
1	බස්නාහිර	23,660,407	61	14,914,450	39	38,574,857
2	මධ්‍යම	17,267,704	75	5,855,523	25	23,123,227
3	දකුණ	14,737,423	77	4,307,197	23	19,044,620
4	උතුර	10,079,725	78	2,891,676	22	12,971,401
5	වයඹ	16,715,277	77	5,130,171	23	21,845,448
6	උතුරු මැද	8,751,685	78	2,458,545	22	11,210,230
7	ඌව	10,603,896	76	3,380,321	24	13,984,217
8	සබරගමුව	13,459,072	77	4,111,829	23	17,570,901
9	නැගෙනහිර	11,663,249	76	3,602,807	24	15,266,056
	එකතුව	**126,938,438**	73	**46,652,519**	27	**173,590,957**

මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු - 2013

අනෙකුත් පුනරාවර්තන වියදම් අවශ්‍යතා සඳහා පළාත් විසින් කරන ලද ඉල්ලීම්, වගුව 21 මගින් විස්තරාත්මකව දක්වා ඇත.

වගුව 21: අනෙකුත් පුනරාවර්තන වියදම්වලට අදාලව පළාත් විසින් කරන ලද ඉල්ලීම් - 2013 පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම්, මුද්දර බදු හා උසාවි දඩ හැර

(රු.'000)

පළාත	වෙනත් පුනරාවර්තන වියදම්
බස්නාහිර	4,480,674
මධ්‍යම	3,553,696
දකුණ	3,003,312
උතුර	1,950,631
වයඹ	3,095,239
උතුරු මැද	1,947,728
ඌව	2,799,860
සබරගමුව	3,055,091
නැගෙනහිර	2,499,336
එකතුව	**26,385,567**

මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු - 2013

5.4 පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම

රජයට නිර්දේශ ඉදිරිපත් කිරීමට ප්‍රථමයෙන් ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් අවශ්‍යතා සඳහා පළාත්වලින් කරන ලද ඉල්ලීම් මුදල් කොමිෂන් සභාව විසින් ප්‍රවේශමෙන් අධ්‍යයනය කරනු ලබයි. පළාත් අවශ්‍යතා තක්සේරු කිරීමේ දී රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුගත වීම, මුදල් කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ, පළාත්වල මධ්‍යකාලීන සංවර්ධන සැලසුම්, මහා භාණ්ඩාගාරය හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත්

කරන ලද චක්‍රලේඛ හා පළාත් අරමුදල් වැය කිරීමේ අතීත කාර්යසාධනය වැනි කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කරනු ලැබේ.

පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීමේ දී ජාතික සංවර්ධන ප්‍රතිපත්ති රාමුව සහ පළාත් මධ්‍යකාලීන සැලසුම් පිළිබඳ සැලකිල්ල යොමු කරමින් පහත දැක්වෙන කරුණු මත පදනම්ව, මුදල් කොමිෂන් සභාව විසින් පරිපූර්ණ විශ්ලේෂණයක් සිදු කරනු ඇත.

(i) සේවා සැපයුම් නඩත්තුව
(ii) සේවා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම
(iii) සැලසුම් කරන ලද ප්‍රතිඵල කාර්යක්ෂමව ළඟා කර ගැනීම
(iv) ද්විකරණය වැළැක්වීම හා සම්පත් නාස්තිය වළකාලීම
(v) ප්‍රමුඛතා අවශ්‍යතාවයන් පිළිබඳ විශේෂ අවධානය
(vi) පළාත් මට්ටමේ ආයතනවල ක්‍රියාත්මක ධාරිතාවය
(vii) අදාලත්වය හා විෂය පථය

5.4.1 ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම

2013 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පළාත් ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරුව, වගුව 22 තුළ දැක්වේ.

වගුව 22: මුදල් කොමිෂන් සභාව විසින් තක්සේරු කරන ලද ප්‍රාග්ධන අවශ්‍යතා - 2013

(රු.මි.)

පළාත	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන		උපමාන පාදක ප්‍රදාන	
	මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය	%	මුදල් කොමිෂන් සභාවේ නිර්දේශය	%
බස්නාහිර	5,671	14.2	1,726	21.6
මධ්‍යම	5,020	12.6	1,008	12.6
දකුණ	4,763	11.9	966	12.1
උතුර	3,699	9.2	583	7.3
වයඹ	4,220	10.5	884	11.1
උතුරු මැද	3,404	8.5	583	7.3
ඌව	4,208	10.5	668	8.4
සබරගමුව	4,776	11.9	847	10.6
නැගෙනහිර	4,239	10.6	735	9.2
එකතුව	**40,000**	**100**	**8,000**	**100.0**

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව

5.4.2 පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීම

පළාවලින් ඉදිරිපත් කරන ලද පුනරාවර්තන අවශ්‍යතා තක්සේරු කිරීමේ දී, මුදල් කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ප්‍රධාන මූලධර්ම කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

(i) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද කාර්යමණ්ඩලය
(ii) සත්‍ය කාර්යමණ්ඩලය හා පුරප්පාඩු
(iii) රේඛීය අමාත්‍යාංශ හා පළාත් සභා විසින් එකඟ වූ නව පත්වීම්
(iv) පුද්ගල පඩිනඩි, වැටුප් හිඟ මුදල් සහ කාර්යමණ්ඩල ණය

(v) ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම ඇතුළු අනෙකුත් පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු
(vi) තේරී පත් වූ සාමාජිකයින් සඳහා දීමනා
(vii) පළාත් පාලන ආයතන හා අනෙකුත් ආයතන සඳහා මාරු කිරීම්

2013 වර්ෂය සඳහා පළාත් සත්‍ය කාර්යමණ්ඩලයට අදාල පුද්ගල පඩිනඩි ඇතුළත් පළාත් පුනරාවර්තන අවශ්‍යතා, වගුව 23 මගින් විස්තර කර ඇත.

වගුව 23: පළාත් සත්‍ය කාර්යමණ්ඩලයට අදාල තක්සේරු කරන ලද පුද්ගල පඩිනඩි - 2013

අංකය	පළාත	සත්‍ය කාර්යමණ්ඩලය	%	පුද්ගල පඩි නඩි (රු.'000)							
				වැටුප් හා වේතන	%	අතිකාල හා නිවාඩු දින ගෙවීම්	%	වෙනත් දීමනා	%	එකතුව (පුද්ගල පඩි නඩි)	%
1	බස්නාහිර	53,864	18	14,542,555	20	825,578	12	5,395,502	18	20,763,635	19
2	මධ්‍යම	40,274	14	9,473,757	13	1,067,787	15	3,697,401	13	14,238,945	13
3	දකුණ	35,234	12	8,686,194	12	701,843	10	3,475,024	12	12,863,061	12
4	උතුර	23,814	8	5,309,886	7	507,976	7	2,260,120	8	8,077,982	7
5	වයඹ	38,580	13	9,294,663	13	655,636	9	3,677,089	13	13,627,388	13
6	උතුරු මැද	20,803	7	4,789,964	7	578,461	8	2,043,863	7	7,412,288	7
7	ඌව	26,198	9	5,887,818	8	913,047	13	2,492,095	9	9,292,960	9
8	සබරගමුව	27,679	9	7,092,620	10	902,086	13	3,155,084	11	11,149,790	10
9	නැගෙනහිර	29,743	10	7,164,112	10	906,477	13	3,061,403	10	11,131,992	10
එකතුව		**296,189**	**100**	**72,241,569**	**100**	**7,058,891**	**100**	**29,257,581**	**100**	**108,558,041**	**100**

මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු 2013 සහ මුදල් කොමිෂන් සභාව
සටහන: පුරප්පාඩු හැර

පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම් සහිතව හා රහිතව පළාත් සඳහා වූ අනෙකුත් පුනරාවර්තන වියදම්, වගුව 24 තුළ දක්වා ඇත.

වගුව 24: පළාත් සඳහා තක්සේරු කරන ලද අනෙකුත් පුනරාවර්තන වියදම් - 2013
මුද්දර බදු හා උසාවි දඩ නොමැතිව

(රු.'000)

අංකය	පළාත	පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම් හැර වෙනත් පුනරාවර්තන වියදම්	%	පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම්	%	පළාත් පාලන ආයතනවලට කරනු ලබන මාරු කිරීම් සමග වෙනත් පුනරාවර්තන වියදම්	%
1	බස්නාහිර	4,480,092	18	4,738,096	46	9,218,188	26
2	මධ්‍යම	2,393,920	9	1,355,555	13	3,749,475	11
3	දකුණ	3,000,112	12	852,719	8	3,852,831	11
4	උතුර	2,814,387	11	740,310	7	3,554,697	10
5	වයඹ	3,094,879	12	759,678	7	3,854,557	11
6	උතුරු මැද	1,944,241	8	275,567	3	2,219,808	6
7	ඌව	2,799,860	11	405,261	4	3,205,121	9
8	සබරගමුව	2,655,091	10	516,902	5	3,171,993	9
9	නැගෙනහිර	2,119,336	8	652,225	6	2,771,561	8
	එකතුව	**25,301,918**	100	**10,296,313**	100	**35,598,231**	100

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව

5.5 පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම

පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීම මුදල් කොමිෂන් සභාව සතු ප්‍රධාන කාර්යයකි. වාර්ෂික අයවැයෙන් පළාත් සඳහා වෙන් කරනු ලබන මුළු මුදල් ප්‍රමාණය පිළිබඳව මහා භාණ්ඩාගාරය සමඟ එකඟත්වයකට පැමිණීමෙන් අනතුරුව, ව්‍යවස්ථාවෙන් පැවරී ඇති කාර්යයක් ලෙස මෙය සිදු කරනු ලබයි. සියළුම පළාත් ආයතන විසින් පිළියෙල කරන ලද ස්වකීය වාර්ෂික අයවැය පළාත් සභාවල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන හෙයින්, මුදල් කොමිෂන් සභාව පළාත් අතර අරමුදල් වෙන් කිරීමේ තම අභ්‍යාසයේදී තක්සේරු කරන ලද පළාත් අවශ්‍යතා කෙරෙහි දැඩිලෙස සැලකිලිමත් වනු ඇත. 2013 වර්ෂය සඳහා පළාත් අතර ප්‍රාග්ධන අරමුදල් (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සහ උපමාන පාදක ප්‍රදාන) බෙදා වෙන් කර ඇති ආකාරය, වගුව 25 මගින් පෙන්නුම් කෙරේ.

වගුව 25: ප්‍රාග්ධන අරමුදල් බෙදා වෙන් කිරීම - 2013

(රු.මි.)

පළාත	උපමාන පාදක ප්‍රදාන	පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන	උප එකතුව	%	සංවර්ධන ව්‍යාපෘති*	එකතුව	%
බස්නාහිර	370	1,266	1,636	13.02	435	2,071	7.68
මධ්‍යම	321	1,229	1,550	12.33	2,025	3,575	13.26
දකුණ	295	1,229	1,524	12.12	405	1,929	7.16
උතුර	195	1,030	1,225	9.75	2,663	3,888	14.42
වයඹ	270	1,137	1,407	11.19	730	2,137	7.93
උතුරු මැද	230	1,000	1,230	9.79	1,140	2,370	8.79
ඌව	240	1,144	1,384	11.01	1,452	2,836	10.52
සබරගමුව	252	1,145	1,397	11.11	1,620	3,017	11.19
නැගෙනහිර	217	1,000	1,217	9.68	3,915	5,132	19.04
එකතුව	**2,390**	**10,180**	**12,570**	**100**	**14,385**	**26,955**	**100**

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව
*ජාතික වශයෙන් එකඟ වූ විදේශීය හා දේශීය ව්‍යාපෘති

ඉහතින් සඳහන් කළ ආකාරයට, සාමූහික ප්‍රදාන තුළින් අපේක්ෂා කෙරෙනුයේ, පළාත්වල පුනරාවර්තන වියදම් පියවා ගැනීමයි. සාමූහික ප්‍රදාන පළාත් අතර බෙදා වෙන් කර ඇති ආකාරය, වගුව 26 මගින් විස්තර කර ඇත.

වගුව 26: සාමූහික ප්‍රදාන බෙදා වෙන් කිරීම - 2013

(රු.'000)

අංකය	පළාත	සාමූහික ප්‍රදාන
1	බස්නාහිර	8,501,755
2	මධ්‍යම	14,863,832
3	දකුණ	12,908,465
4	උතුර	10,075,295
5	වයඹ	14,118,105
6	උතුරු මැද	7,345,621
7	ඌව	10,263,208
8	සබරගමුව	13,088,463
9	නැගෙනහිර	11,635,256
	එකතුව	**102,800,000**

මූලාශ්‍රය: මුදල් කොමිෂන් සභාව

රේඛීය අමාත්‍යාංශ විසින් පළාත්වලට අළුතින් බඳවා ගැනීමට නියමිත කාර්යමණ්ඩල සඳහා 2013 වර්ෂයට අදාල පුද්ගල පඩිනඩිවල අන්තර්ගත වනුයේ, මුළු අවශ්‍යතාවයෙන් 50% ක් පමණි.

5.6 පළාත් පාලන ආයතන මූල්‍යකරණය

පළාත් පාලන ආයතනවල අනුමත සත්‍ය කාර්යමණ්ඩලයේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා සඳහා පළාත්වලින් කරනු ලබන මාරු කිරීම් පුනරාවර්තන වියදමෙහි ප්‍රධාන කොටසක් වේ. වර්තමානයේ දී කාර්යමණ්ඩලවල වැටුප් වෙනුවෙන් ගෙවන මුළු මුදල් ප්‍රමාණය සාමූහික ප්‍රදාන යටතේ සපයනු ලබන අරමුදල්වලින් ප්‍රතිපූරණය කෙරේ. කොන්ත්‍රාත් හා අනියම් පදනමින් සිටින කාර්යමණ්ඩලයට පළාත් පාලන

ආයතන විසින් එකතු කරන ලද ආදායමින් ගෙවීම් සිදු කරන ලදී. ඔවුන්ගෙන් කොටසක් මේ වන විට අනුමත කාර්යමණ්ඩලයට අන්තර්ග්‍රහණය කර ඇති බැවින්, මුළු වැටුප් ප්‍රමාණයම සාමූහික ප්‍රදාන යටතේ මාරු කරන ලද අරමුදල්වලින් ගෙවීමට සිදු වනු ඇත. මෙම තත්වය තුළ, ඉදිරියේදී පළාත් පාලන ආයතනවලින් එකතු කරන ලද ආදායම කොන්ත්‍රාත් හා අනියම් පදනම මත සිටින කාර්යමණ්ඩලයේ වැටුප් ගෙවීම සඳහා වැය කිරීම අවශ්‍ය නොවන බව නිරීක්ෂණය කළ හැකිය. ඒ අනුව එකතු කළ ආදායම මහජනතාවට සපයනු ලබන සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා යෙදවීමට නිර්දේශ කෙරේ.

සාමාජිකයින්ගේ දීමනා සහ කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිපූරණය කිරීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල් ප්‍රමාණය, වගුව 27 තුළ දක්වා ඇත.

වගුව 27: පළාත් පාලන ආයතනවල සාමාජිකයින්ගේ දීමනා සහ කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිපූරණය සඳහා අරමුදල් වෙන් කිරීම - 2013

(රු.'000)

පළාත	මහ නගර සභා	නගර සභා	ප්‍රාදේශීය සභා	පළාත් පාලන ආයතන මුළු එකතුව	සාමාජිකයින්ගේ දීමනා		කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිපූරණය		මුළු එකතුව
					සාමාජිකයන් ගණන	දීමනාව	සත්‍ය	මුදල	
බස්නාහිර	7	14	27	48	882	61,914	16,183	4,676,182	4,738,096
මධ්‍යම	4	6	33	43	634	42,895	5,025	1,312,660	1,355,555
දකුණ	3	4	42	49	582	39,126	2,935	813,593	852,719
උතුර	1	5	28	34	398	27,030	2,587	713,280	740,310
වයඹ	1	3	29	33	492	32,976	2,485	726,702	759,678
උතුරු මැද	1	0	25	26	294	20,034	942	255,533	275,567
ඌව	2	1	25	28	319	21,948	1,304	383,313	405,261
සබරගමුව	1	3	25	29	424	28116	1,731	488,786	516,902
නැගෙනහිර	3	5	37	45	448	31,680	2,079	620,545	652,225
එකතුව	**23**	**41**	**271**	**335**	**4473**	**305,719**	**35,271**	**9,990,594**	**10,296,313**

මූලාශ්‍රය: පළාත් අයවැය ඇස්තමේන්තු සහ මුදල් කොමිෂන් සභාව - 2012

6. පළාත් සංවර්ධනයේ ඉදිරි ගමන

ජාතික සංවර්ධන ප්‍රතිපත්තිය රාමුව තුළ ප්‍රාදේශීය වශයෙන් තුලිත සංවර්ධනයක් සඳහා සම්පත් ප්‍රශස්ත ලෙස යෙදවීමේ අවශ්‍යතාවය පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව, රජයේ පශ්චාද් ගැටුම් සංවර්ධන උපාය මාර්ග කෙරෙහි සැලකිලිමත් වෙමින්, පළාත් සැලසුම්කරණය තුළට වඩා ගැලපෙන නව ප්‍රවේශයක් හඳුන්වාදීම සඳහා මුදල් කොමිෂන් සභාව ක්‍රියා කර තිබේ. එම ප්‍රවේශයට අයත් ප්‍රධාන මූලධර්ම පහත දැක්වේ.

6.1 ප්‍රාදේශීය සංවර්ධන මූලාරම්භයන් සමඟ අනුගත වීම

එක් එක් පළාත තුළ දක්නට ලැබෙන සුවිශේෂීතාවය, විවිධත්වයෙන් යුක්ත සම්පත්, විභවතාවයන් සහ තුලනාත්මක ප්‍රතිලාභ මත පදනම් කොට ගනිමින් රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව තුළ පළාත් විශේෂිත සංවර්ධන මූලාරම්භයන් හඳුනාගෙන ඇත. එක් එක් පළාත සඳහා හඳුනාගත් වැඩසටහන් පහත පරිදි වේ.

- රජරට උදානය - උතුරු මැද
- කඳුරට උදානය - මධ්‍යම
- පුබුදමු වෙල්ලස්ස - ඌව
- සබරගමුව අරුණාලෝකය - සබරගමුව
- උතුරු වසන්තය - උතුර
- නැගෙනහිර නවෝදය - නැගෙනහිර
- වයඹ පුබුදුව - වයඹ
- රුහුණු උදාව - දකුණ
- රන් අරුණ - බස්නාහිර

මෙම ජාතික මට්ටමේ උපායමාර්ග සමඟ අනුගත වන පරිදි මධ්‍යකාලීන සැලසුම් හා වාර්ෂික සැලසුම් සැකසීමට පහසු වන පරිදි, පළාත් කේන්ද්‍රකොට ගනිමින් මුදල් කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ නිකුත් කර තිබේ.

6.2 ප්‍රාදේශීය විෂමතාවයන් අවම කිරීම

සාමාන්‍යයෙන් ගත් විට රට පුරා සමාජ - ආර්ථික සංවර්ධනයක් සිදුවී තිබුණ ද, ප්‍රාදේශීය මට්ටමෙන් සංවර්ධනය මැන බැලීම සඳහා භාවිතා කෙරෙන සමහර දර්ශකවලට අනුව, විශේෂයෙන් හුදකලා මෙන්ම නොදියුණු භූගෝලීය කලාප තුළ අන්තර් හා ඇතුළත වශයෙන් වූ විෂමතාවන් දක්නට ලැබේ. මෙම අයහපත් තත්ත්වය සැලකිල්ලට ගෙන "ජනතාවගේ අවම ශුභ සාධන මට්ටම" සහතික කරලීමට හැකි වන පරිදි සම්පත් උපයෝජනයේදී ඉහළ ප්‍රමුඛතාවක් ලබාදීමට මුදල් කොමිෂන් සභාව තම මාර්ගෝපදේශවල විශේෂ අවධානයක් යොමු කර ඇත. සාධාරණ සම්පත් ව්‍යාප්තියක් හරහා මානව සංවර්ධනය තුළ සමානාත්මතාව පවත්වාගෙන යනු වස් සංවර්ධන ආර්ථික විද්‍යාඥයින් විසින් මෙම සංකල්පය නිර්දේශ කර තිබේ.

6.3 ආයතනික ප්‍රතිඵල රාමුව පිළිබඳ ප්‍රවේශය

මුදල් කොමිෂන් සභාව විසින් 2011 වර්ෂයේ සිට පළාත්වල අනුගමනය කෙරෙන ප්‍රායෝගික සැලසුම් ක්‍රමවේදයක් ලෙස "ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය" හඳුන්වා දෙන ලදී. ආංශික පදනමින් මෙම

ප්‍රවේශය භාවිතයට ගැනීමේ දී යම් යම් දුෂ්කරතාවලට පළාත් අධිකාරීන් මුහුණ දුන් බව නිරීක්ෂණය විය. මෙම තත්ත්වය තේරුම් ගැනීමෙන් අනතුරුව ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශයෙහි වැඩිදියුණු කරන ලද අනුවාදයක් වන "ආයතනික ප්‍රතිඵල රාමුව" වෙත විතැන් වීමක් සිදු විය. පළාත් මට්ටමේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සැලසුම්කරණය පිළිබඳ කුසලතාවන් වැඩිදියුණු කිරීම අරමුණු කොටගෙන, මුදල් කොමිෂන් සභාව විසින් ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය පිළිබඳ පළාත් මට්ටමේ වැඩමුළු රාශියක් සංවිධානය කරන ලදී.

2013 වර්ෂයේ සිට ස්වකීය මධ්‍යකාලීන සංවර්ධන සැලසුම්, ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය මත පදනම්ව සකස් කරන ලෙස, කොමිෂන් සභාව විසින් පළාත්වලට උපදෙස් සපයන ලදී. මෙම ක්‍රියාවලිය පහසු කරලනු වස් කොමිෂන් සභාව විසින් නව ආකෘති පත්‍ර කුලකයක් හඳුන්වා දෙනු ලැබීය. (ඇමුණුම I බලන්න). එම ආකෘති පත්‍ර සැකෙවින් පහත පරිදි වේ.

(i) **ආකෘති පත්‍ර 1 : ආයතනික ප්‍රතිඵල රාමුව**
මෙම ආකෘති පත්‍රයට අනුව පළාතේ මධ්‍යකාලීන සංවර්ධන වැඩසටහන සකස් කළ යුතු අතර, ඒ තුළට පළාත් සම්පත් පැතිකඩ, දැක්ම, මෙහෙවර, ප්‍රමුඛ පරාස, අරමුණු සහ ප්‍රතිඵලවලට අයත් දර්ශක අන්තර්ගත විය යුතුවේ.

(ii) **ආකෘති පත්‍ර 2 : වාර්ෂික පළාත් අවශ්‍යතා**
මෙය පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සමඟ සම්බන්ධ වන අතර, ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා මෙම ආකෘති පත්‍රයට අනුව විවිධ අංශ හා ආයතන යටතේ අපේක්ෂිත අයවැය ඉදිරිපත් කළ යුතුවේ.

(iii) **ආකෘති පත්‍ර 3 : වාර්ෂික සංවර්ධන සැලැස්ම (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන)**
අනුමත අයවැය සැලකිල්ලට ගනිමින් වාර්ෂික පළාත් ආයෝජන සැලැස්ම මෙයට අනුව සැකසිය යුතුවේ.

(iv) **ආකෘති පත්‍ර 4 : අවිච්ඡේද වැඩ හා අතැති බිල් සඳහා වූ මුදල් ඉල්ලීම**
අවිච්ඡේද වැඩ නිම කිරීම හා අතැති බිල් පියවීම සඳහා අවශ්‍ය මුදල් මෙම ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම් කළ යුතුවේ.

එක් එක් පළාත විසින් විවිධ ප්‍රමුඛ පරාස අනුව ප්‍රතිඵල (නිමැවුම සහ ප්‍රතිවිපාක) හඳුනාගත යුතු අතර, ප්‍රමුඛ පරාස නියෝජනය වන පරිදි ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහ ඉලක්ක සැකසිය යුතුවේ. මෙම ආයතනික ප්‍රතිඵල රාමුව, 2013 – 2017 කාලය ආවරණය වන පරිදි වසර පහක් සඳහා විය යුතුය. එක් එක් ආයෝජන පැකේජයට හොඳ ඵලදාවක් ලැබෙන පරිදි ස්වකීය සම්පත් කාර්යක්ෂමව යෙදවීමට සියලු පළාත් ආයතන ක්‍රියා කිරීම මෙහිදී අපේක්ෂා කෙරේ.

සියලුම ආයතනික මට්ටමේ සැලසුම් ඒකරාශී කොට පළාත් මධ්‍යම කාලීන සැලැස්ම සම්පාදනය කිරීම, පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් අපේක්ෂා කෙරේ. මෙලෙස සකසන ලද පළාත් මධ්‍යකාලීන සංවර්ධන සැලසුම්, ජනාධිපති ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් 2012 නොවැම්බර් මස 06 දින පැවති රැස්වීමක දී නිල මට්ටමෙන් ප්‍රකාශයට පත් කෙරිණි. මෙම මධ්‍යකාලීන සංවර්ධන සැලසුම්වල සඳහන් ප්‍රමුඛතාවන් සැලකිල්ලට ගෙන අදාල ආකෘති පත්‍ර භාවිතා කරමින් වාර්ෂික සංවර්ධන සැලසුම් සකස් කොට ඉදිරිපත් කිරීම පළාත් බලධාරීන්ගෙන් අපේක්ෂා කෙරිණි.

6.4 ප්‍රතිඵල පාදක අධීක්ෂණය සහ ඇගයීම

පළාත් සංවර්ධන සැලසුම් අධීක්ෂණය කිරීමේ දී හා අගැයීමේ දී නිසි හා සමාන ආකාරයේ ක්‍රමවේදයක් නොමැති බව මුදල් කොමිෂන් සභාවට අවබෝධ විය. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන, මුදල් කොමිෂන්

සභාව විසින් 2013 වර්ෂයේ සිට ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය පදනම් කොටගෙන "ප්‍රතිඵල පාදක අධීක්ෂණ සහ ඇගයුම් ක්‍රමවේදයක්" හඳුන්වාදෙන ලදී. මෙම ක්‍රියාවලිය පහසුකරලනු වස් ආදර්ශ ආකෘති පත්‍ර දෙකක් (ඇමුණුම I බලන්න) හඳුන්වා දෙන ලද අතර, ඒවා පහත පරිදි වේ.

(i) **ආකෘති පත්‍ර 5 : ප්‍රතිපත්තිමය මට්ටමේ අධීක්ෂණය**
මෙම ආකෘති පත්‍රය භාවිතා කරනුයේ ප්‍රතිපත්ති මට්ටමේ කමිටුවක් මඟින් වාර්ෂික ආයෝජන සැලසුම්වල ප්‍රගතිය මැන බැලීම සඳහා ය. මෙම කමිටුව ප්‍රධාන ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු, පළාත් අමාත්‍යාංශ ලේකම්වරු හා පළාත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් සමන්විත වේ.

(ii) **ආකෘති පත්‍ර 6 : ක්‍රියාත්මක මට්ටමෙන් අධීක්ෂණය**
මෙම ආකෘති පත්‍රය භාවිතයට ගනිමින් භෞතික හා මූල්‍ය ප්‍රගතිය මෙන්ම, කෙටි කාලීන අරමුණු පදනම් කොටගෙන ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළිබඳ අධීක්ෂණය කිරීම අපේක්ෂා කෙරේ. දෙපාර්තමේන්තු හා ඒකක ප්‍රධානීන්ගෙන් සමන්විත ක්‍රියාත්මක මට්ටමේ කමිටුවකින් මෙම අධීක්ෂණ ක්‍රියාවලිය සිදු කළ යුතුය.

6.5 පළත් කාර්ය මණ්ඩලය ප්‍රශස්ත ලෙස උපයෝජනයට ගැනීම

මහජනතාවට සතුටුදායක සේවයක් ලබාදීමේ අරමුණින් පළාත් සභා සහ පළාත් පාලන ආයතන සතුව පවත්නා මානව සම්පත් පදනමෙහි දර්ශකයක් ලෙස අදාල ආයතනයන්හි කාර්ය මණ්ඩලය දැක්විය හැකිය. ඒ අනුව, පළාත් සභා හා පළාත් පාලන ආයතනවල ප්‍රශස්ත කාර්ය මණ්ඩල හඳුනා ගැනීම සහ වාර්ෂික මූල්‍ය අවශ්‍යතාවයන් තක්සේරු කිරීම මුදල් කොමිෂන් සභාව විසින් සිදු කළ යුතු ප්‍රධාන කාර්යයකි. ස්වකීය ආයතන සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩල සපයා දීම පිළිබඳ තාර්කිකව සලකා බලන ලෙස පළාත් හා පළාත් පාලන මට්ටමේ අධිකාරීන් කිහිප දෙනෙකු විසින් ඉල්ලීමක් සිදු කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස රජය විසින් එක් එක් පළාතේ හා පළාත් පාලන ආයතනවල ප්‍රශස්ත කාර්ය මණ්ඩල පිළිබඳව තක්සේරුවක් කිරීම සඳහා කමිටුවක් පත් කිරීමට ක්‍රියා කරන ලදී. එයට අයත් ආයතන වූයේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂම, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා මුදල් කොමිෂන් සභාවයි. මෙම කමිටුව මේ වන විට ස්වකීය කාර්යය නිම කර ඇති අතර, නිර්දේශිත කාර්ය මණ්ඩල සඳහා මහා භාණ්ඩාගාරයේ නිල අනුමැතිය ලැබී ඇත.

6.6 පළාත් පාලන ආයතනවල ධාරිතාව ඉහළ නැංවීම

1987 වර්ෂයේ දී දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වාදීමට ප්‍රථමයෙන් පළාත් පාලන විෂය පැවරී තිබුණේ ජාතික මට්ටමේ පළාත් පාලන අමාත්‍යාංශය වෙතය. පළාත් පාලන ආයතනවල සමස්ත පරිපාලනය එයට අයත් වූ අතර, ඒවා විසුරුවා හැරීමේ බලය ද ඒ තුළ විය. මෙම ක්‍රමය යටතේ අදාල පාර්ලිමේන්තු පනත් මඟින් ලබාදුන් බලතල අනුව, පළාත් පාලන ආයතන විසින් ස්වකීය කටයුතු සිදු කරන ලදී. දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පළාත් පාලනය බලය, බෙදා හැරීමට අදාල විෂයයක් ලෙස ඇතුළත් කිරීම නිසා පළාත් පාලන ආයතනවල පරිපාලනය පළාත් සභා වෙත පැවරිණි. මෙම වෙනස්කම යටතේ පාලන තන්ත්‍රයෙහි තුන් වන හා දෙවන ස්තර ලෙස පිළිවෙලින් පළාත් පාලන ආයතන හා පළාත් සභා පත් විය. එමෙන්ම, පළාත් පාලන ආයතනවලට මග පෙන්වීම හා ඒවා අධීක්ෂණය කිරීම පිළිබඳ බලතල පළාත් සභාවලට පැවරිණි. මෙම තත්ත්වය තුළ මූල්‍ය හා පරිපාලන බලතල සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන සතුව තිබූ ස්වාධීනතාවය තරමක් දුරට අඩු විය.

මෙම තත්ත්වය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව, පළාත් පාලන ආයතනවල පුනරාවර්තන වියදම් අවශ්‍යතාවයන් පියවා ගැනීම සඳහා මුදල් ප්‍රදානයන් සැපයීමට අමතරව, සේවා සැපයීම් අදාල කර ගනිමින් මුදල් ලබාදීම සඳහා විෂය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම කොමිෂන් සභාව විසින් සිදු කර ඇත. මේ අනුව, පළාත් පාලන මාර්ග සහ පානීය ජල සැපයුම, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වැනි අනෙකුත් පළාත් පාලන සේවා ආවරණය වන පරිදි වෙනම මුදල් වෙන් කිරීමක් සිදු කෙරේ.

6.7 පළාත් ආදායම් නිලධාරීන්ගේ සේවය සඵලදායී අයුරින් යොදවා ගැනීම

2011 වර්ෂයේ දී ව්‍යාපාර පිරිවැටුම් බද්ද අහෝසි කිරීම හා ජාතික මට්ටමෙන් එකතු කරන ලද ආදායම බෙදා ගැනීමේ ක්‍රමවේදය හඳුන්වාදීම සමඟ පළාත් ආදායම් නිලධාරීන්ගේ රාජකාරි වැඩ ප්‍රමාණය වේගයෙන් අඩු වීමක් දක්නට ලැබේ. මෙම නිලධාරීන්, ජාතික ආදායම් නිලධාරීන්ගේ සේවාවට අන්තර්ග්‍රහනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් වුවද, විවිධ කරුණු හේතුකොටගෙන එය ප්‍රතික්ෂේප විය. මෙම තත්ත්වය තුළ පළාත් ආදායම් නිලධාරීන්ගේ සේවය විකල්පමය ක්‍රමවේදයක් හරහා ඵලදායී ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් විවිධ අයුරේ සාකච්ඡාවන් සිදු වුව ද, අවසන් තීරණයක් නොමැතිව ඒවා නිමා විය. පූර්ණ වශයෙන් භාවිතයට නොගත් පළාත් හා පළාත් පාලන මට්ටමේ ආදායම් මූලාශ්‍ර රාශියක් දක්නට ඇති හෙයින්, ඒවා එකතු කිරීම සඳහා මෙම නිලධාරීන්ගේ සේවය ලබාගත යුතු බවට යෝජනා කෙරේ. පසුගිය වසර කිහිපය තුළ දී, පළාත් පාලන ආයතන මඟින් එකතු කළ හැකිව තිබූ විශාල ප්‍රමාණයක ආදායම එකතු නොකළ බව නිරීක්ෂණය වී ඇත. මේ සඳහා විවිධ හේතු බලපාන ලද අතර, වත්කම් තක්සේරු කිරීම ප්‍රමාද වීම, මානව සම්පත් හිඟ වීම, විශ්වාසය තැබිය හැකි දත්ත පදනමක් නොතිබීම හා උවමනාවෙන්ම ආදායම් එකතු නොකිරීම වැනි කරුණු ඉන් ප්‍රධාන වේ. මෙවැනි පළාත් හා ප්‍රාදේශීය මට්ටමෙන් දැකිය හැකි ආදායම් මූලාශ්‍ර විභවතාවයන් පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඒවා කාර්යක්ෂමව රැස් කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම පිණිස මෙම පළාත් ආදායම් නිලධාරීන් යොදවා ගැනීමට නිර්දේශ කෙරේ. ඊට අමතරව, ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය මත පදනම් වූ සානුබල දීමනා ක්‍රමයක් පළාත් ආදායම් නිලධාරීන් සඳහා හඳුන්වාදීම ද වැදගත් ක්‍රියාමාර්ගයක් ලෙස යෝජනා කළ හැකිය.

6.8 පුනරාවර්තන වියදම් තුළින් අත්කර ගනු ලැබූ ප්‍රතිලාභ පිළිබඳ අධ්‍යයනය

පුනරාවර්තන වියදම් පිළිබඳ පොදු මතය වනුයේ, එමඟින් අදාල ආයතනයට හෝ සමාජයට අගය කළ හැකි ඵලදාවක් නොලැබෙන අතර, එය මුදල් නාස්තියක් පමණක් බවයි. මුළු පළාත් වියදම් ගත් විට, සාමාන්‍යයෙන් 80% ක් පමණ පුනරාවර්තන ස්වභාවයේ වියදම් වශයෙන් වැය කෙරේ. එයින් ප්‍රධානත්වය හිමි වන්නේ වැටුප් හා අනෙකුත් දීමනාවලටය. මෙවැනි විශාල ප්‍රතිශතයක් පුනරාවර්තන වියදම් ලෙස වැය කිරීම තුළින් පැහැදිලිව නොපෙනෙන ප්‍රතිලාභ රාශියක් පවතින බව කිව යුතුය. පළාත් අධ්‍යාපන හා සෞඛ්‍ය යන අංශවල සේවා නියුක්තව සිටින සංඛ්‍යාව, මුළු පළාත් සේවක සංඛ්‍යාවෙන් 40% ක් පමණ වන අතර, ඒ තුළට ගුරුවරු, හෙදියන්, වෛද්‍යවරු හා වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ අනෙකුත් සේවකයින් ප්‍රධාන වශයෙන් අයත් වේ. මොවුනගෙන් ඉටුවන සේවාව මනා ඇගයීමකට ලක් නොවුවද එමඟින්, මහජනතාවට ඍජු ප්‍රතිලාභ බෙහෙවින් අත්වන බව ප්‍රකාශ කළ යුතුය. මෙම තත්ත්වය කෙරෙහි අවධානය යොමු කිරීමෙන් අනතුරුව, සෞඛ්‍ය අධ්‍යාපන, කෘෂිකර්ම, පශු සම්පත්, වාරිමාර්ග, සමාජ සේවා සහ මාර්ග යන අංශවලට අදාල පුනරාවර්තන වියදම් ඇසුරින් අත් වන ප්‍රතිලාභ පිළිබඳව අධ්‍යයනයක් කිරීම සඳහා මුදල් කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. මේ සඳහා අවශ්‍ය දත්ත අදාල පළාත් ආයතන වෙතින් ලබාගෙන තිබෙන අතර, කොමිෂන් සභාව විසින් ඒවා විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව වාර්තාවක් සකස් කොට ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

7. නිගමනය

රජය විසින් 2016 වන විට රටෙහි දිළිඳුකම පිටුදැකීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබාදී ඇත. අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අයවැය කථාවෙහි මේ සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මග පෙන්වීම්වලට ප්‍රධානත්වයක් හිමි කර දී තිබේ. අයවැය කථාවෙහි සඳහන් කර ඇති පරිදි "2016 වන විට ශ්‍රී ලංකාව දිළිඳු බවින් තොර මධ්‍යම ආදායම් කාණ්ඩයේ ආර්ථිකයක් හා සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ අභිබවා ගිය රටක් බවට පත් කිරීම රජයේ අරමුණ වේ".

භාණ්ඩාගාර ලේකම්වරයා විසින් සියලුම පළාත්වල ප්‍රධාන ලේකම්වරුනට නිකුත් කර ඇති උපදෙස්වලට අනුව රටෙහි හුදකලා වූ සහ නොදියුණු ප්‍රදේශවල වෙසෙන හා ආර්ථික හා සමාජයීය වශයෙන් අවාසි සහගත තත්ත්වයකට ලක් වූ පවුල්වල ජීවන මට්ටම ඉහළ නැංවීම පිණිස මහජන මුදල් ආයෝජනය කිරීම සහතික කළ යුතුවේ. වර්ෂ 2016 වන විට දිළිඳුකමෙන් තොර ශ්‍රී ලංකාවක් සහතික කරලීමේ අරමුණින් පළාත් විසින් සකසනු ලබන සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් ආදායම් උත්පාදනය, රැකියා බිහි කිරීම සහ එකතු කළ අගය ඉහළ නැංවීම හරහා දිළිඳුකම අඩුකරලීමට දායක වන පරිදි සැලසුම් කළ යුතු බවට මග පෙන්වීම් සිදුකොට ඇත. ස්වකීය සංවර්ධන උපායමාර්ග සැකසීමේදී තිරසාරභාවය සහතික කිරීමේ අරමුණින්, රජය විසින් නිර්මාණය කරනු ලබන වත්කම් කළමනාකරණයේ දී පෞද්ගලික අංශයේ සහභාගිත්වය ලබාගැනීම සඳහා පළාත් බලධාරීන් කටයුතු කිරීම අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රතිපත්තිමය මග පෙන්වීම් තවදුරටත් ක්‍රියාවට නංවනු පිණිස පළාත් අධිකාරීන් විසින්, හුදකලා නොදියුණු ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ දිළිඳුකම පිටුදැකීමේ අරමුණ ඇතිව ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා විශේෂයෙන් ආයෝජන කළ යුතු බව පළාත්වලට යවන ලද මාර්ගෝපදේශ තුළින් අවධාරණය කිරීමට මුදල් කොමිෂන් සභාව ක්‍රියා කර ඇත. ජනාධිපති ලේකම්තුමා විසින් සපයන ලද උපදෙස්වලට අනුව යමින් මධ්‍යකාලීන හා වාර්ෂික සංවර්ධන සැලසුම් සැකසීමේ දී ප්‍රතිඵල පාදක කළමනාකරණ ශිල්ප ක්‍රමය මත පදනම්ව ආයතනික ප්‍රතිඵල රාමු ප්‍රවේශය අනුගමනය කිරීමෙහි ලා මුදල් කොමිෂන් සභාව විසින් පළාත්වලට පහසුකම් සැපයීමේ කාර්යය සිදු කොට තිබේ. මේ සම්බන්ධයෙන් සියලුම පළාත්, මුදල් කොමිෂන් සභාවට පූර්ණ සහයෝගය ලබා දී තිබෙන අතර, ප්‍රශස්ත සම්පත් උපයෝජනයක් සිදු වන අයුරින් ව්‍යාපෘති හා වැඩසටහන් සකසා ඇත.

එමෙන්ම, නිමැවුම් හා ප්‍රතිවිපාක වශයෙන් අපේක්ෂිත ප්‍රතිඵල සමඟ සංවර්ධන කාර්යයන් සම්බන්ධ කරලීමට ක්‍රියාමාර්ග ගෙන තිබෙන බව ද කිව යුතුය. ප්‍රතිපත්තිමය හා ක්‍රියාත්මක තලයේදී කාර්යක්ෂම අධීක්ෂණ ක්‍රියාවලියක් තහවුරු කරලීම සඳහා පළාත් විසින් ප්‍රධාන කාර්ය සාධන දර්ශක කිහිපයක් හඳුනාගෙන තිබේ. තවද, මුදල් කොමිෂන් සභාව විසින් ආයතනික ප්‍රතිඵල රාමුව පදනම් කොට ගනිමින් මධ්‍යකාලීන සංවර්ධන සැලසුම් පිළියෙල කරන ලෙස පළාත් අධිකාරීන්ට උපදෙස් දී ඇත. එමෙන්ම, ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීමේ අරමුණ ඇතිව නිමැවුමෙන් ඔබ්බට ගොස් ප්‍රතිඵල (ප්‍රතිවිපාක හා බලපෑම) පිළිබඳ අවධාරණය කිරීමේ අවශ්‍යතාවය ද පෙන්වා දී තිබේ.

දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් පවරන ලද දැඩි වගකීම සැලකිල්ලට ගෙන, පළාත් අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය අරමුදල් නිර්ණය කිරීමේදී හා පළාත් විසින් අත්කර ගත යුතු ආදායම් ඉලක්ක තීරණය කිරීමේ දී මහා භාණ්ඩාගාරය සමඟ සමීප සංවාදයක් පවත්වා ගෙන ගොස් තිබේ. එම අරමුදල් පළාත් අතර බෙදා වෙන් කිරීමේ දී, රටෙහි දක්නට ලැබෙන ප්‍රාදේශීය විෂමතා අවම කරලනු වස්, ඒක පුද්ගල ආදායම, දරිද්‍රතා අනුපාතය, ජනගහනයේ පළාත් සංයුතිය හා සේවා වියුක්ති අනුපාතය වැනි නිර්ණායක පිළිබඳව වැඩි සැලකිලිමත් බවක් දක්වා ඇත. තවද, හුදකලා නොදියුණු ප්‍රදේශ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් "ජනතාවගේ අවම ශුභ සාධන මට්ටම" පවත්වා ගෙන යෑම කෙරෙහි නිසි අවධානය යොමු කර ඇත.

ගොඩනැගිලි හා අනෙකුත් භෞතික ව්‍යුහයන්ගේ ඉදිකිරීම් සම්බන්ධයෙන් ගත්විට අත්‍යවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සහ පරිසර හිතකාමී හා අරපිරිමැසුම්දායක තාක්ෂණය භාවිතා කිරීම කෙරෙහි සැලකිලිමත් වන අතර, පිළිගත් ප්‍රසම්පාදන ක්‍රියාවලින් අනුගමනය කිරීම මඟින් රට තුළ තිරසාර සංවර්ධනයක් සහතික කිරීමට පළාත් යොමු කර තිබේ. පළාත් මට්ටමෙන් "ඊ රාජ්‍ය ප්‍රතිපත්තිය" පිළිබඳ දැනුවත්භාවය ලබාදීමටත්, කොමිෂන් සභාව සහ පළාත් අතර ආයතනික වෙබ් අඩවි සම්බන්ධතා ඇති කරලීම සඳහාත් මුදල් කොමිෂන් සභාව, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කර ඇත. මේ අනුව, කොමිෂන් සභාව සහ පළාත් අතර ඉලෙක්ට්‍රොනික සන්නිවේදන සම්බන්ධතා ඇති කරලීම මඟින් පළාත් සංවර්ධන සැලසුම් සැකසීමේ ක්‍රියාවලිය වඩාත් පහසු කරවීමට හැකිවී තිබේ.

සෑම මට්ටමකින්ම පාහේ ආයෝජන පරතරයන් පියවීම සඳහා පෞද්ගලික අංශයේ සහයෝගය ලබා ගැනීමේ උපාය මාර්ගයක් ලෙස "රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රවේශය" (PPP approach) ක්‍රියාවට නැංවිය යුතු බව රජය විසින් පැහැදිලිව අවධාරණය කර ඇත. මෙම උපායමාර්ගය, තෝරාගත් අංශ කිහිපයක් සඳහා පමණක් (වරාය හා බලශක්ති වැනි) ජාතික මට්ටමෙන් අනුගමනය කළේ වුවද, මේ සම්බන්ධව පළාත් හෝ ප්‍රාදේශීය මට්ටමෙන් සැලකිය යුතු ප්‍රගතියක් දක්නට නොමැත. සාමාන්‍යයෙන් දක්නට ලැබෙනුයේ, පළාත් හා ප්‍රාදේශීය මට්ටමේ ආයතන ස්වකීය සංවර්ධන කාර්යයන් සඳහා රාජ්‍ය අරමුදල් පමණක් යෙදවීමේ ප්‍රවණතාවයකි. මේ තුළින් රාජ්‍ය අයවැය ලේඛනයට අධික බරක් දැරීමට සිදුවීම පැහැදිලිව පෙනෙන ප්‍රතිඵලය වේ. මෙම සන්දර්භය තුළ, උප ජාතික මට්ටමේදී විකල්ප ආයෝජන උපායමාර්ගයක් ලෙස "රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රවේශය" අනුගමනය කිරීමෙහි ලා රජය විසින් ඉහළ ප්‍රමුඛතාවයක් ලබාදී ඇත. ප්‍රාදේශීය මට්ටමෙන් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය දිරිගැන්වීම පිණිස සංචාරක කර්මාන්තය, පොදු සේවා සැපයීම, දේශීය නිෂ්පාදන අලෙවිය සහ පොදු පහසුකම් සැපයීම වැනි අංශ තෝරාගත යුතු බවට කොමිෂන් සභාව විසින් උපදෙස් සපයා ඇත. පළාත් පාලන ආයතනවලින් අපේක්ෂා කෙරෙනුයේ, වත්කම් නිර්මාණය සඳහා මෙන්ම පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් කාර්යක්ෂම අයුරින් නියාමනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආයෝජන යොමු කළ යුතු බවයි. පොදු සේවා සැපයීම (උදා. විවේක ගැනීමේ ස්ථාන, අලෙවි මධ්‍යස්ථාන, රථ වාහන නවතා තැබීමේ ස්ථාන සහ ආහාර ගැනීමේ ස්ථාන) පෞද්ගලික ආයතන ලවා සිදු කළ යුතු අතර, ඒ සඳහා සේවා ගාස්තුවක් අය කිරීමට ඔවුනට අවකාශ ලබාදිය යුතු වේ. ප්‍රතිලාභීන්ගෙන් අය කරනු ලබන සේවා ගාස්තු භාවිතයට ගනිමින් මෙම වත්කම්වල නඩත්තු හා ක්‍රියාකාරී පිරිවැය පියවා ගැනීමට පුළුවන.

අවසාන වශයෙන් සඳහන් කළ යුතු කරුණක් වනුයේ, බොහෝ පළාත් විසින් ජනතාවගේ, විශේෂයෙන් නොදියුණු ප්‍රදේශවල ජීවත් වන පවුල්වල ජීවන තත්ත්වය ඉහළ නැංවීම කේන්ද්‍ර කොටගෙන ව්‍යාපෘති හා වැඩසටහන්වල අරමුදල් ආයෝජනය කිරීමට පියවර ගෙන ඇති බවයි. අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රයන්හි අත්කරගෙන ඇති ප්‍රගතිය හා මාර්ග, විදුලිබල හා ජල සැපයුම වැනි ග්‍රාමීය අංශයට අයත් යටිතල පහසුකම්වල ඇතිවී තිබෙන සීඝ්‍ර සංවර්ධනය තුළින් මෙය ප්‍රායෝගිකව සනාථ වේ. හුදු අන්තර් ප්‍රාදේශීය සංවර්ධන පදනමින් පමණක් නොව, ඇතුළත ප්‍රාදේශීය සංවර්ධන පදනමින් ද මෙම අංශ සංවර්ධනය කළ හැකි අතර, ඉතා පුළුල් ක්ෂේත්‍රයක් තුළ පිරිවැය සාඵල්‍යතාවයෙන් යුක්තව සංවර්ධනය පතුරුවාලීමට ද හැකියාව ලැබෙනු ඇත.

පළාත් අතර අරමුදල් බෙදා වෙන් කිරීමට අදාලව රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී, රට තුළ තුලිත ප්‍රාදේශීය සංවර්ධනයක් ලඟා කර ගැනීම සහතික කරලීමේ අරමුණින් ඉහත දක්වන ලද ප්‍රධාන කරුණු කෙරෙහි නිසි අවධානය යොමු කරන ලදී.

.

ආරියරත්න හේවගේ
පත්කළ සාමාජික සහ සභාපති

පී.බී.ජයසුන්දර
නිල බලයෙන් සාමාජික

අජිත් නිවාඩ් කබ්රාල්
නිල බලයෙන් සාමාජික

එම්.එන්.ජුනයිද්
පත්කළ සාමාජික

සී.පී.ඊ.ගුණසිංහම්
පත්කළ සාමාජික

ඇමුණුම I

ආකෘති පත්‍ර 1

ආයතනික ප්‍රතිඵල රාමුව

(සැලසුම්කරණය පාදක ප්‍රතිඵල රාමුව)

පළාත: ....

අමාත්‍යාංශය:..

දෙපාර්තමේන්තුව/ ආයතනය: ....

දැක්ම

දැක්ම යනු සංවිධානයක නියමු සාමාජිකයන්ගේ සිහිනයක් පිළිබඳ රචිත පින්තූරයකි

- දිගු කාලීන අරමුණු සහ වටිනාකම් පද්ධතිය (ජාතික උපායමාර්ගයට අනුගත වන පරිදි ඉදිරි වර්ෂ 05 තුළ ලඟා කර ගැනීමට අවශ්‍ය වනුයේ කුමක් ද?)
  - ධනාත්මක
  - අනාගතය පිළිබඳ වූ
  - අභිප්‍රේරණය
  - අවසන් ප්‍රතිඵලය

මෙහෙවර

මෙහෙවර යනු "අප නියැලී සිටින්නේ කුමන කාර්යයක ද?/ ඉදිරියේ දී එම කාර්යය කුමක් විය යුතු ද?"

- සංවිධානයේ අනන්‍යතාවය (සංවිධානය පවත්වාගෙන යාමට හේතු සහ එහි අරමුණු)
  - සපයනු ලබන සේවාවන් (කුමක් ද?)
  - ඉලක්කගත කණ්ඩායම (කා හට ද?)
  - සේවා සපයනු ලබන ක්‍රමවේදයන් (කෙසේ ද?)
  - වටිනාකම් පද්ධතිය
    - සමාජ වගකීම
    - ආචාර ධර්ම පිළිබඳ සංකල්පය
    - සංවිධාන දර්ශනය

ප්‍රමුඛ පරාස

සංවිධානයක ප්‍රමුඛ පරාස යනු අදාල මෙහෙවර ලබා කර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ යුතු ප්‍රධාන කාර්යයන් වේ. (ආයතනයක ප්‍රමුඛ පරාස සංඛ්‍යාව 05 නොඉක්මවිය යුතුය)

- පොදුවේ ගැනෙන ක්‍රියාකාරකම්
- සංවිධානයක ප්‍රධාන කාර්යයන්

අරමුණු

අරමුණු යනු මෙහෙවර ලබා කර ගැනීම පිණිස සංවිධානයක් විසින් ප්‍රමුඛ පරාසයන් තුළ සැලකිලිමත් විය යුතු අවසන් ප්‍රතිඵලය වේ. (නිමැවුම හෝ ප්‍රතිවිපාක)

ප්‍රධාන කාර්යසාධන දර්ශක

ප්‍රධාන කාර්යසාධන දර්ශක යනු සංවිධානයක් ස්වකීය අරමුණු ලබා කර ගැනීමේ දී අධීක්ෂණ කටයුතුවලදී භාවිතා කරනු ලබන දර්ශකයි. (ආරම්භයේ දී නිමැවුම ගැන සැලකිලිමත් වුව ද ප්‍රධානත්වය හිමිවිය යුත්තේ ප්‍රතිවිපාකවලටය)

ප්‍රධාන කාර්යසාධන දර්ශකවල මූලික අංග - SMART:

- S – විශේෂිතභාවය
- M – මිනියහැකි බව
- A – ලබා කර ගත හැකි බව
- R – යථාර්තවාදී බව/ අදාල බව
- T – කාල රාමුවකට බැඳී පැවතීම

මූලික පදනම

මූලික පදනම යනු අරමුණට අදාලව ආරම්භක අවස්ථාවේ පැවති මට්ටමයි

ඉලක්කය

වමසුමට භාජනය වන එක් එක් වර්ෂය තුළ ලබා කර ගත් මට්ටම

මධ්‍ය කාලීන ආයතනික ප්‍රතිඵල රාමුව

දෙපාර්තමේන්තුව/ ආයතනය:..

ප්‍රමුඛ පරාසය 1: ....

අරමුණු අංකය	අරමුණු	ප්‍රධාන කාර්යසාධන දර්ශක	මූලික පදනම 2011	ඉලක්ක					
				2012	**2013**	**2014**	**2015**	**2016**	**2017**
1.1									

ආකෘති පත්‍ර **2**

වාර්ෂික පළාත් අවශ්‍යතාවය – පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන

පළාත: ....

අමාත්‍යාංශය:..

දෙපාර්තමේන්තුව/ ආයතනය: ....

ප්‍රමුඛ පරාසය 1: ....

අරමුණු අංකය	අරමුණු	ප්‍රධාන කාර්යසාධන දර්ශක	මූලික පදනම	ඉලක්ක		ප්‍රමුඛතාවය අනුව ව්‍යාපෘති	2013 සඳහා ඇස්තමේන්තුව (රු.මි.)
			2011	2012	2013		
උප එකතුව							

ප්‍රමුඛ පරාසය 2: ....

අරමුණු අංකය	අරමුණු	ප්‍රධාන කාර්යසාධන දර්ශක	මූලික පදනම	ඉලක්ක		ප්‍රමුඛතාවය අනුව ව්‍යාපෘති	2013 සඳහා ඇස්තමේන්තුව (රු.මි.)
			2011	2012	2013		
උප එකතුව							

<u>ප්‍රමුඛ පරාසයන් යටතේ අවශ්‍යතාවල සාරාංශය</u>

ප්‍රමුඛ පරාසය	උප එකතුව (රු.මි.)
1.	
2.	
මුළු එකතුව	

ආකෘති පත්‍ර 3

වාර්ෂික සංවර්ධන සැලැස්ම (පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන) – 2013

පළාත: ....

අමාත්‍යාංශය:...

දෙපාර්තමේන්තුව/ ආයතනය: ....

ප්‍රමුඛ පරාසය 1: ....

ප්‍රමුඛ පරාසය 1 සඳහා ඇස්තමේන්තුව (රු.මි.):...

අරමුණු අංකය	අරමුණු	ප්‍රධාන කාර්යසාධන දර්ශක	මූලික පදනම	ඉලක්ක		ප්‍රමුඛතාවය අනුව ව්‍යාපෘති	ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනීම පිණිස පුළුල් ක්‍රියාත්මක පරාසයන්	2013 සඳහා ඇස්තමේන්තුව (රු.මි.)
			2011	2012	2013			
						1.	1.1	
							1.2	
							1.3	
						2.	2.1	
							2.2	
							2.3	
උප එකතුව								
විශේෂ කරුණු:-								

දෙපාර්තමේන්තුව/ ආයතනය: ....

අඛණ්ඩ වැඩ හා අතැති බිල් පත් සඳහා ඉල්ලුම

රු.මි.

ව්‍යාපෘති	අඛණ්ඩ වැඩ	අතැති බිල් පත්	එකතුව
1.			
2.			
3.			
එකතුව			

වාර්ෂික ඇස්තමේන්තුවේ සාරාංශය

රු.මි.

ආකෘති පත්‍ර 3 අනුව නව වැඩ සඳහා ඉල්ලුම	
අඛණ්ඩ වැඩ හා අතැති බිල් පත් සඳහා ඉල්ලුම	
එකතුව	

ආයතනික ප්‍රතිඵල රාමුව
ප්‍රතිපත්ති මට්ටමේ දී ප්‍රතිඵල ඇගයීම

පළාත: ....

අමාත්‍යාංශය:..

දෙපාර්තමේන්තුව/ ආයතනය: ....

ප්‍රමුඛ පරාසය 1: ....

අරමුණු අංකය	අරමුණු	ප්‍රධාන කාර්යසාධන දර්ශක	මූලික පදනම 2011	2012		2013		දත්ත මූලාශ්‍රය	දත්ත එකතු කිරීමේ වගකීම
				ඉලක්කය	ලඟා කර ගැනීම	ඉලක්කය	ලඟා කර ගැනීම		

සටහන:- ප්‍රධාන කාර්යසාධන දර්ශක හා ඉලක්ක ආකෘති පත්‍ර 1න් උපුටා ගත යුතුය

ආකෘති පත්‍ර 6

ආයතනික ප්‍රතිඵල රාමුව
ක්‍රියාත්මක මට්ටමේ දී ප්‍රතිඵල ඇගයීම

පළාත: ....

අමාත්‍යාංශය:.......................................

දෙපාර්තමේන්තුව/ ආයතනය: ....

ප්‍රමුඛ පරාසය 1: ....

අරමුණු අංකය	ප්‍රධාන කාර්යසාධන දර්ශක	ලඟා කරගත් ඉලක්ක	ව්‍යාපෘති	ප්‍රධාන කාර්යසාධන දර්ශකය ලඟා කර ගැනීම පිණිස ප්‍රමුඛ ක්‍රියාත්මක පරාසයන් (කාර්යසාධනය)	භෞතික ප්‍රගතිය						මූල්‍ය ප්‍රගතිය (රු.මි.)						නිමැවුම (ප්‍රධාන කාර්ය සාධන දර්ශක අනුව)	කා විසින් ද?
					ජන-ජුනි		ජුලි-සැප්		ඔක්-දෙසැ		ජන-ජුනි		ජුලි-සැප්		ඔක්-දෙසැ			
					සැලසුම්ගත	සත්‍ය	සැලසුම්ගත	සත්‍ය	සැලසුම්ගත	සත්‍ය	සැලසුම්ගත	සත්‍ය	සැලසුම්ගත	සත්‍ය	සැලසුම්ගත	සත්‍ය		

සටහන:- *ප්‍රධාන කාර්යසාධන දර්ශක හා ඉලක්ක ආකෘති පත්‍ර 1න් උපුටා ගත යුතුය*